# වයඹ පලාත් පාලන දෙපාර්තමේන්තුව

# වෙන්නප්පුව ප්‍රාදේශීය සභාව

## 2023 වර්ෂයේ /59 වන සභා වාරයේ මහා සභා රැස්වීම් වාර්තාව

## 2023-01-12

### පැමිණීම

1. ගරු සභාපති කේ.වී.සුසන්ත පෙරේරා මහතා
2. ගරු උපසභාපති  ආර්.ඒ.නිලංක සඳකැල් මහතා
3. ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා
4. ගරු මන්ත්‍රී ඩබ්.ඇලෙක්ස් නිශාන්ත ප්‍රනාන්දු මහතා
5. ගරු මන්ත්‍රී ඩබ්.ජෝන් බැප්ටිස් ප්‍රනාන්දු මහතා
6. ගරු මන්ත්‍රී යූ.ජුඩ් එම්මානුවෙල් මහතා
7. ගරු මන්ත්‍රිනී ආර්.නිරෝෂා ජීවන්ති ප්‍රනාන්දු මහත්මිය
8. ගරු මන්ත්‍රී කේ.නාමල් අනුරුද්ධ සිරිවර්ධන ප්‍රනාන්දු මහතා
9. ගරු මන්ත්‍රී එම්.එම්.ජිනේන්ද්‍ර විශ්වනාත් මංචනායක මහතා
10. ගරු මන්ත්‍රී කේ.එල්.චමින්ද කුමාර කරුණානායක මහතා
11. ගරු මන්ත්‍රිනී ජී.ලීනා ප්‍රියංගිකා පෙරේරා මහත්මිය
12. ගරු මන්ත්‍රිනී ජේ.කේ.දීපා මේරි අයිරංගනී පෙරේරා මහත්මිය
13. ගරු මන්ත්‍රී කේ.නොඑල් සුදත් ජානක පෙරේරා මහතා
14. ගරු මන්ත්‍රිනී අයි.එච්.නයෝමි රම්‍යලතා මහත්මිය
15. ගරු මන්ත්‍රී ඩබ්.ඒ.රෙන්ෆ්‍රිඩ් ෂවීන් ප්‍රනාන්දු මහතා
16. ගරු මන්ත්‍රී ආර්.පී.අකිල ශිරංග රාජපක්ෂ මහතා
17. ගරු මන්ත්‍රී ඩී.එල්.අමල් සුරංග මහතා
18. ගරු මන්ත්‍රී ඩබ්.ස්ටැන්ලි තිසේරා මහතා
19. ගරු මන්ත්‍රී ජී.අශේන් විමුක්ති ප්‍රනාන්දු මහතා
20. ගරු මන්ත්‍රී එච්.ඒ.ක්ලීටස් පෝල් පෙරේරා මහතා
21. ගරු මන්ත්‍රී සී.පී.සරත් වික්‍රමරත්න මහතා
22. ගරු මන්ත්‍රී එල්. සුසන්ත ශ්‍රීනාත් ප්‍රනාන්දු මහතා
23. ගරු මන්ත්‍රී ඩී.නිමල් අරුණ ශාන්ති විජේතුංග මහතා
24. ගරු මන්ත්‍රී බී.ඒ.එස්.ශාන්ත පෙරේරා මහතා
25. ගරු මන්ත්‍රී ඩබ්.සුරේන් ඇන්ටන් ශ්‍රීනාත් ප්‍රනාන්දු මහතා
26. ගරු මන්ත්‍රිනී එච්.එම්.එස්.බී. කරුණාරත්න මෙනවිය
27. ගරු මන්ත්‍රිනී ඩබ්.දුලක්ෂි චමෝදරී ප්‍රනාන්දු මහත්මිය

28. ගරු මන්ත්‍රී වී.ඒ.වර්ණ රංග ගුණසේකර මහතා
29. ගරු මන්ත්‍රී ඩබ්.ඒ.ගෝඨාභය වික්‍රමසිංහ මහතා
30. ගරු මන්ත්‍රිනී ඒ.එම්.චමිලා දිල්රුක්ෂිකා මහත්මිය
31. ගරු මන්ත්‍රී අයි.බී.සෑම් හරිෂ්නාත් සරත්චන්ද්‍ර මහතා
32. ගරු මන්ත්‍රී එස්.එම්.දර්ශන දිමුතු කුමාර සුභසිංහ මහතා

මෙදින පෙ.ව.10.00ට මහා සභා රැස්වීමේ කටයුතු ගරු සභාපති කේ.වී.සුසන්ත පෙරේරා මහතාගේ ප්‍රධානත්වයෙන් වෙන්නප්පුව ප්‍රාදේශීය සභා මහා සභා රැස්වීම් ශාලාවේදී ආරම්භ විය.

ආගම සිහිකිරීමෙන් අනතුරුව සියළුම දෙනාට නව වසරට සුභ පතමින් මහා සභා රැස්වීම සඳහා සහභාගී වී සිටින ගරු උපසභාපතිතුමා ඇතුළු සියළුම ගරු මන්ත්‍රීතුමන්/තුමියන් හා සහභාගී වී සිටින ලේකම්මහතා හා එම නිලධාරීන් ඇතුළු සියළු දෙනාම 2023 වර්ෂයේ පළමු මහා සභා රැස්වීම සඳහා ගරු සභාපතිතුමා විසින් පිළිගන්නා ලදී.

## 01. 2022-12-08 වන දින පැවති මහා සභා රැස්වීම් වාර්තාව සම්මත කිරීම.

අද දින 59 වන මහා සභා රැස්වීම් වාරය පවත්වන බවත්,60 වන රැස්වීම් වාරයද පැවැත්වීමට අවකාශය ලැබේවායි ප්‍රාර්ථනා කරමින් මෙම රැස්වීම් වාර්තාව සත්‍ය වාර්තාවක් බවට ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා යෝජනා කරන ලදී.එම යෝජනාව ගරු මන්ත්‍රී යූ.පුඩ් එම්මානුවෙල් මහතා ස්ථිර කරන ලදී.

| |
|---|
| තීරණ අංක 01<br><br>2022-12-08 වන දින පැවති මහා සභා රැස්වීම් වාර්තාව සත්‍ය වාර්තාවක් බවට ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතාගේ හා ගරු මන්ත්‍රී යූ.පුඩ් එම්මානුවෙල් මහතාගේ යෝජනා ස්ථිරත්වයෙන් සභා සම්මත විය. |

මහා සභාව මඟින් පැන නැඟුණ කරුණු කාරණා තිබේනම් ඒවා ඉදිරිපත් කිරීමට ගරු සභාපතිතුමා විසින් අවස්ථාව ලබා දෙන ලදී. එමෙන්ම හිටපු ලේකම් පෝල් ප්‍රනාන්දු මහතාට මහා සභාවේදී එක් කල සුභාශිංසනය පොත් පිංචක් මඟින් එතුමාගේ අවසන් උත්සවයේදී ලබා දුන් බවත් ගරු සභාපතිතුමා ප්‍රාකාශ කරන ලදී.

- ❖ ගරු මන්ත්‍රී එම්.එම්.ජිනේන්ද්‍ර විශ්වනාත් මංචනායක මහතා ගරු සභාපතිතුමාගෙන් අවසර ගැනීමෙන් පසුව එදින ගිවිසුම් කාලය දීර්ඝ කිරීම සම්බන්ධයෙන් සාකච්ඡා කල බවත්,එහිදී මාස කීපයක් ප්‍රමාද වූ පිරිසක් ඇතුළත් කර තිබූ බවත්,එය නැවත නිවැරදි කර දමන ලෙසට පැවසූ බවත්,අනුමැතියක් නොමැතිව ගෙවීම් කර තිබූ බවත් ප්‍රකාශ කරන ලදී.

එය නිවැරදිව සකස් කර ඉදිරිපත් කර තිබූ බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

එසේ නම් අප විසින් අනුමත කිරීම වරදක් බව ගරු මන්ත්‍රී එම්.එම්.ජිනේන්ද්‍ර විශ්වනාත් මංචනායක මහතා ප්‍රකාශ කරන ලදී.දීමනාව ගෙවූ පසුව සභාවට අනුමත කල නොහැකි බව ප්‍රකාශ කරන ලදී. සේවා කාලය දීර්ඝ කිරීමට අනුමැතියක් නොමැති පිරිසකට පඩිය ගෙවීම වරදක් සිදු වී ඇති බවත්,සභාවද නොමඟ යවා ඇති බවත් එහිදී යම් දිනක මන්ත්‍රීවරුන්ටද මෙය අධිභාරයක් වී පැමිණිය හැකි බවත් ප්‍රකාශ කරන ලදී.මේ සම්බන්ධව පැහැදිලි කිරීමක් ඉදිරිපත් කරන ලෙසට ඉල්ලා සිටින ලදී.

නිලධාරීතුමිය අද දින සිටින බවත්,එතුමියව ගෙන්වා තොරතුරු විමසමුයැයි ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

- ❖ මෙම වාර්තාවේ 7වන පිටුවේ අවසානයේ දංකොටුව වෙලඳ සංකීර්ණයේ කඩ කාමර පිළිබඳ ගැටළුව පිළිබඳව සඳහන් කර තිබෙන බවත්, ".ඊළඟ වාරය වන විට සභාව පවත්වන්නට හැකිවේදැයි නොදන්නා බවත්,නමුත් ඊට පෙර මෙම ලිපි ගොනුව ඉදිරිපත් කර අවශ්‍ය උපදෙස් ගෙන මේ සඳහා පියවරයක් ගනිමුයැයිද වැඩිදුරටත් ප්‍රකාශ කරන ලදී.දින 14ක් ඇතුළත එම කඩ කාමර විවෘත කරන ලෙසත්,නැතිනම් ඉවත් වන ලෙසටත් දැන්වීමක් කර මෙම කටයුත්ත සිදු කරමුයැයිද ප්‍රකාශ කරන ලදී.අදාල තැනට ගොස් කමිටු නොපවත්වන ලෙසත්,අදාල පිරිසව සභාවට ගෙන්වන ලෙසත් ප්‍රකාශ කරන ලදී." ලෙස සඳහන් වී ඇති බව ගරු මන්ත්‍රී සී.පී.සරත් වික්‍රමරත්න මහතා ප්‍රකාශ කරන ලදී. මේ සම්බන්ධයෙන් ගරු සභාපතිතුමාගෙන්ද විමසා සිටින ලදී.

මේ සඳහා සිකුරාදා දින හදිසියේම පොදු පහසුකම් කමිටුව පවත්වන ලෙසට කමිටු සභාපතිතුමාට දැනුම් දුන් බවත්,සවිස්තරව තොරතුරු ගෙනැවිත් අප විසින් සාකච්ඡා කල තොරතුරුද විශ්ලේෂණය කර අප සභාවේ වැඩ අධිකාරි මහතා සහ ඉංජිනේරු මහතාවද ගෙනැවිත් මේ සම්බන්ධයෙන් අවශ්‍ය කරන කටයුත්ත සිදු කරන ලෙසට තමන් නියෝගයක් ලබා දී ඇති බවත් ප්‍රකාශ කරන ලදී.සභාව මඟින් සාකච්ඡා කල කරුණු තිබෙන බවත්, සභාව මඟින් සිදු කල නිරීක්ෂණයන් තිබෙන බවත් ඒවා සියල්ල ගෙන කටයුතු කල හැකි බවත්,විශේෂයෙන්ම එම ස්ථානයේ එලවළු කඩ කීපයක් තිබෙන බවත්,ඒවා සියල්ල ගරු මන්ත්‍රී ඩී.එල්.අමල් සුරංග මහතා සම්බන්ධ වී එම ගැටළුව නිරාකරණය කර දෙන බව පැවසූ බවත් මේ සියල්ල එකතු කර ගෙන කමිටු සභාපති ගරු මන්ත්‍රී යූ.පුඩ් එම්මානුවෙල් මහතාට මෙම කටයුත්ත සිදු කිරීමට උපදෙස් ලබා දී ඇති බවත් ප්‍රකාශ කරන ලදී.මෙම ගැටළුව සම්බන්ධයෙන් ලේකම්

මහතාටද අත්දැකීමක් තිබෙන බවත්,සියළුම දෙනා එකතු වී මෙම ගැටළුවට විසඳුමක් ලබා දෙන ලෙසත් ප්‍රකාශ කරන ලදී.

මෙම කඩ කාමර වලට පමණක් නොව එසේ නම් පොදු පහසුකම් කමිටුවේ කතා කරන අනෙක් දේවල්ද මෙලෙස සිදු විය යුතු බවත්,මන්ද කතා කරන දේවල් එලෙසම එළියට නොපැමිණෙන බවත්,මීන් පෙර මහා සභාවේදීද තමන් මෙම ගැටළුව පෙන්වා දුන් බවත් ගරු මන්ත්‍රී එම්.එම්.ජිනේන්ද්‍ර විශ්වනාත් මංචනායක මහතා ප්‍රකාශ කරන ලදී. ආදායම් පරීක්ෂකවරුන් පැමිණ එතැනින් එකඟ වී පිළිගෙන යන බවත්,එළියට ගියපසුව ඔවුන් තවත් දෙයක් සිදු කරන බවත් ප්‍රකාශ කරන ලදී.කමිටුවේ ලේකම් ජේ.ඒ.ඩී.ඒ.පී.එස්.ජයසූරිය මහතාද මෙතැන සිටින බවත්, සභාව ඉදිරියේ තිබෙන පුවරුව පිළිබඳව සාකච්ඡාවේදී එය ඉවත් කිරීම එකඟ වූ බවත් ලිපියක් යවන බවට පැවසූ බවත් නමුත් ඉන් පසුව කමිටුවට තමන්ට සහභාගී වීමට නොහැකි වූ බවත් එදින එම කඩ කාමරයේ අයිතිකරුවා පැමිණ රු.8000.00ක් එම පුවරුවට අය කල බව පවසා තිබූ බවත් ප්‍රකාශ කරන ලදී.එදින ආදායම් පරීක්ෂක මහතා කමිටුව නොමඟ යැවීමක් කර ඇති බවත්,මුදල් ගෙවූ රිසිට් පත පරීක්ෂා කලේ දැයි තමන් නොදන්නා බවත් ප්‍රකාශ කරන ලදී.

මේ සියල්ලම සිකුරාදා කමිටුවේදී සාකච්ඡා කර අවසන් කරන ලෙසට දැනුම් දී ඇති බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.මේ වන විට බොහෝ කඩ කාමර වසා දමා ඇති බවත් තවදුරටත් ප්‍රකාශ කරන ලදී.

මේ සඳහා සභාවට මැදිහත් වී සභාවේ නම ලොකුවට ගසා පොදු පුවරුවක් සාදා දීමට තිබූ බවත්,සභාවේ නම හරහට ගසා ඇති බවත් සභාවේ නම පෙනීමට සභාව අසලටම පැමිණිය යුතු බවත් නමුත් එම ව්‍යාපාරයේ නාම පුවරුව ඈතින් එන විට දෙපසින්ම පෙනීමට විශාලව ප්‍රදර්ශනය කර ඇති බවත් එවිට මෙය වෙළඳ සංකීර්ණයක්ද සභාවක්ද යන ගැටළුව මතු වන බවත් ගරු මන්ත්‍රී එම්.එම්.ජිනේන්ද්‍ර විශ්වනාත් මංචනායක මහතාප්‍රකාශ කරන ලදී එබැවින් සභාවේ නම ඉහළින් ලොකුවට ගසා එම ව්‍යාපාර වල නම් පහළින් කුඩාවට දමන ලෙසත් මේවා ඉතාමත් ඉක්මනින් සිදු කල හැකි කටයුතු බවත්,ගත් තීරණයක් ඉක්මනින් ක්‍රියාත්මක කිරීමට තිබෙන බවත් ප්‍රකාශ කරන ලදී. මාසයකට වරක් මහා සභාව කමිටු රැස්වන බවත්,මහා සභාවට ලෙසම කමිටු වලටද නිවාඩු දමා සහභාගී වන බවත් නමුත් පැයක් දෙකක් සාකච්ඡා කර ගන්නා තීන්දු තීරණ ක්‍රියාත්මක නොවන බවත් නිලධාරීන් සිදු නොකරන බවත් එසේ නොමැති නම් නිලධාරීන්ට මේවා සිදු කිරීමට ඉඩ ලබානොදෙන බවත් එබැවින් කාලය කා දමා යන බවත් එවැනි තත්ත්වයට සභාව පත් නොකරන ලෙසත් ඉල්ලා සිටින ලදී.වසර 5ක් ගෙවී ගොස් ඉදිරියේදීද කුමන මොහොතක හෝ ඡන්දයක් පැමිණෙන බවත් ඡන්දයෙන් පසුව මේවා සිදු කරන බවට පැවසිය නොහැකි බවත් පුළුවන් කාරණා හෝ සිදු කල යුතු බවත් තවදුරටත් ප්‍රකාශ කරන ලදී.

ගරු මන්ත්‍රී එම්.එම්.ජිනේන්ද්‍ර විශ්වනාත් මංචනායක මහතා පවසන කාරණය සත්‍යය බවත්,එම ආදායම් පරීක්ෂක මහතා පළමු දින මෙම පුවරුව සඳහා මුදලක් අයකල බව නොපැවසුව බව කමිටු සභාපති ගරු මන්ත්‍රී යූ.ජූඩ් එම්මානුවෙල් මහතා ප්‍රකාශ කරන ලදී. ඉන් පසුව තිබූ කමිටුවට වෙළඳසැල දැනට පවත්වාගෙන යන පුද්ගලයාව කැඳවූ බවත්,සෑම බල ප්‍රදේශයකම පවත්වාගෙන යන ව්‍යාපාර ස්ථාන වල මෙලෙස නාම පුවරුවක් ගසා ගෙන සිටින බව එහිදී ඔහු පැවසූ බවත්,මෙය වෙනත් ව්‍යාපාර ලෙස නොව ව්‍යාපාරයේ ස්වභාවය අනුව අනිවාර්යයෙන් ජනතාව මෙය දැකිය යුතු බවත් එවිට පාරිභෝගිකයින් පැමිණෙන බවත් නමුත් එලෙස එපා නම් මෙම ස්ථානයෙන් මෙම ව්‍යාපාරය වෙනත් ස්ථානයකට ගෙන යන බව පැවසූ බවත් ප්‍රකාශ කරන ලදී. කමිටුවේ ගරු මන්ත්‍රීවරුන්ද මෙය විශේෂ අවධානයකට ලක් කර එලෙස නොකරන ලෙසට පැවසූ බවත් රු.50,000ක පමණ ආදායමක් සභාවට අහිමි වීම පිළිබඳව මන්ත්‍රීවරුන්ටද ගැටළුවක් මතු වූ බවත් ප්‍රකාශ කරන ලදී. ගරු මන්ත්‍රී එම්.එම්.ජිනේන්ද්‍ර විශ්වනාත් මංචනායක මහතා පවසන කාරණා සත්‍ය බවත් තීන්දු තීරණ ගන්නා විට ඒවා ක්‍රියාත්මක විය යුතු බවත්,එසේ නොවී මෙම පාරිභෝගික මහතාව සහ මන්ත්‍රීවරුන්ව අනවශ්‍ය ගැටළුවකට පත් වී එම පුද්ගලයා මෙම ස්ථානයෙන් ගියහොත් ආදායමට ප්‍රශ්නයක් ඇති බවත් එබැවින් සාකච්ඡා කර අවසන් තීරණයක් ගනිමුයැයි ප්‍රකාශ කරන ලදී.

සිකුරාදා කමිටුවේදී මෙය සාකච්ඡා කර තීන්දු තීරණ සියල්ලම ගෙන අවසන් කරන ලෙසට ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

මෙය කමිටුවේදී සාකච්ඡා කර අවසන් කල නොහැකි බවත් එහිදී කමිටුවේ සාමාජිකයින් පමණක් සිටින බවත් මේ පිළිබඳව කමිටුවේදී බෙහෝ සාකච්ඡා කල බවත් ගරු මන්ත්‍රී එම්.එම්.ජිනේන්ද්‍ර විශ්වනාත් මංචනායක මහතා ප්‍රකාශ කරන ලදී.පොදු පුවරුවක් ගසා එම පුවරුවේ එම ව්‍යාපාරයට ස්ථානයක් ලබා

දෙන ලෙසත් මෙහි කඩ කාමර පහ හයක් තිබෙන බවත් එම සියළුම ව්‍යාපාර තනි තනි පුවරු ගැසුවහොත් කුමක් සිදු වේදැයිද විමසා සිටින ලදී.

පොදු පුවරුවක් ගැසුවහොත් මෙම ගැටළුව විසදෙන බවත්,සියළුම දෙනාගේ ව්‍යාපාර නම් එයට ඇතුළත් කල හැකි බවත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

දෙපසින්ම පෙනෙන ආකාරයට වර්ණවත් පුවරුවක් ගැසිය හැකි බවත් ගරු මන්ත්‍රී එම්.එම්.ජිනේන්ද්‍ර විශ්වනාත් මංචනායක මහතා ප්‍රකාශ කරන ලදී.

අදම මේ සඳහා තීන්දුවක් ගනිමුයැයි ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.සභාවේ නම ඉහළින්ම දමා පහළින් අනෙක් ව්‍යාපාර වල නම් පෙනෙන ලෙසට පුවරුවක් සකස් කර මෙම කටයුත්ත අවසන් කරමුයැයි තවදුරටත් ප්‍රකාශ කරන ලදී.

එම පුවරුව ඉවත් කිරීමට පෙර නව පුවරුව සකස් කර සිටින ලෙස ගරු මන්ත්‍රී ඩබ්.ජෝන් බැප්ටිස් ප්‍රනාන්දු මහතා ප්‍රකාශ කරන ලදී.

එම ගෙවීම කල ආදායම් පරීක්ෂක නිලධාරියා කවුරුන්දැයි ඒ වන විට නොදැන සිටි බව පැවසූ බවත්,එම නිලධාරියා පිළිබඳව හා එම මුදල සභාවට පැමිණ තිබෙන බවටසේ වන විට ගරු සභාපතිතුමා දැනුවත්දැයි ගරු මන්ත්‍රීනී අයි.එච්.නයෝමි රම්‍යලතා මහත්මිය විමසා සිටින ලදී.

එම මුදල සභාවට පැමිණ තිබෙන බවත්,නිළධාරියා පිළිබඳවද දැනුවත් බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

33 වන පිටුවේ තීරණ අංක 20 යටතේ "දන්කොටුව කටුකෙන්ද ප්‍රදේශයේ සිටින එදිරිසිංහ මහතා මගින් මෙම මැදි කැලේ ඉඩම මැනුම් කටයුතු සිදු කිරීම සුදුසු බවත්, වැඩ අධිකාරී මහතා සහ විමර්ශණ නිලධාරීන්වද ගෙන්වා මෙය සිදු කරමුයැයිද ගරු සභාපතිතුමා යෝජනා කල අතර එම යෝජනාව ගරු මන්ත්‍රී ඩබ්.ඒ.ගෝඨාභය වික්‍රමසිංහ මහතා ස්ථිර කරන ලදී. ඒ අනුව ඒ සඳහා ගරු මහා සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදී." ලෙස සඳහන් වී තිබෙන බවත් ගරු මන්ත්‍රී සී.පී.සරත් වික්‍රමරත්න මහතා ප්‍රකාශ කරන ලදී.මේ පිළිබඳව විමසා සිටින ලදී.

එදිරිසිංහ මහතාව ගෙනැවිත් මනින ලෙසට දැනුම් දී ඇති බවත්,2022-12-20 වන දින එතුමාට ලිපිය යවා ඇති බවත්, එතුමා පැමිණ මැනුම් කටයුතු කල පසුව ඉදිරි කටයුතු සිදු කරමුයැයි ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

- සේවා ගිවිසුම් කාලය අළුත් කිරීම පිළිබඳව තොරතුරු ඉදිරිපත් කිරීමට විෂයභාර නිලධාරීතුමිය පැමිණ තිබෙන බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

- ගරු සභාපතිතුමාගේ හා ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතාගේ යෝජනා ස්ථිරත්වයෙන් මහා සභා අවස්ථාව කාරක සභා අවස්ථාවක් බවට පත් කර නිලධාරීතුමියට මේ පිළිබඳව සභාව දැනුවත් කිරීම සඳහා අවස්ථාව සලසා දෙන ලදී.

මෙහිදී 2022 පෙබරවාරි මස සේවකයින් 22 දෙනෙකුගේ සේවා කාලය අළුත් කිරීමට ලැයිස්තුවක් කුරුණෑගල යවා ඇති බවත්,නමුත් එයට අනුමැතිය නොපැමිණි බවත් තමන් අගෝස්තු මස මෙම ආයතනයට පැමිණි බවත් ඉන් පසුව ලේකම් මහතා සමඟ සාකච්ඡා කර කුරුණෑගලට කතා කර මේ පිළිබඳව විමසූ බවත්,මින් පෙර පළාත් පාලනයේ මෙම විෂය කල නිලධාරීතුමියද ස්ථාන මාරු ලබා ගොස් තිබූ බවත් ප්‍රකාශ කරන ලදී.මෙහිදී අඩුපාඩුවක් තිබෙන බවට එම නිලධාරීතුමිය පැවසූ බවත් මින් පෙර අනුමැතිය දුන් නම් ලැයිස්තුවේ නොමැති නමක් එම ලැයිස්තුවට ඇතුළත් කර තිබූ බැවින් එය ප්‍රමාද වූ බව පැවසූ බවත් හිටපු ලේකම් මහතා යන දිනය වන තෙක් ඒ සම්බන්ධයෙන් කතා කල බවත් හැකි ඉක්මනින් එය සකස් කර එවන ලෙසට පැවසූ බවත් ප්‍රකාශ කරන ලදී.එම අනුමැතිය නොලැබී තිබූ බැවින් සභාවට ඉදිරිපත් කිරීමට ප්‍රමාද වූ බව ප්‍රකාශ කරන ලදී.

මේ සම්බන්ධයෙන් ගරු මන්ත්‍රී එම්.එම්.ජිනේන්ද්‍ර විශ්වනාත් මංචනායක මහතා තොරතුරු විමසා සිටින ලදී.

ගරු මන්ත්‍රීවරුන්ද මේ සම්බන්ධයෙන් අදහස් ඉදිරිපත් කරන ලදී.

මෙහිදී කුරුණෑගලින් ප්‍රමාදය සිදු වී ඇති බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.මාස 6න් 6ට අනුමැතිය අවශ්‍ය බවත් ප්‍රකාශ කරන ලදී.

- ✪ ගරු සභාපතිතුමාගේ හා ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතාගේ යෝජනා ස්ථිරත්වයෙන් මහා සභා අවස්ථාව කාරක සභා අවස්ථාවක් බවට පත් කර ලේකම් මහතාට මේ පිළිබඳව සභාව දැනුවත් කිරීම සඳහා අවස්ථාව සලසා දෙන ලදී

මෙම සංඛ්‍යාවටම 2022-02-10 වන දින සිට අගෝස්තු මාසය වන තෙක් අනුමැතිය ගෙන ඇති බවත්, 2021 සිට 2022 පෙබරවාරි මස වන තෙක් ඉන් පෙර අනුමැතිය ගෙන ඇති බවත්,එම සභා අනුමැතිය ගැනීමද ප්‍රමාද වී ගෙන ඇති බවත් ලේකම් මහතා ප්‍රකාශ කරන ලදී.එම ප්‍රමාදයද මේ සඳහා බලපා ඇති බවත් මෙහිදී කුරුණෑගලින් ප්‍රමාද වීම මෙහිදී පවසන බවත් නමුත් ගරු මන්ත්‍රීතුමා පවසන කාරණය සත්‍ය බවත් තවදුරටත් ප්‍රකාශ කරන ලදී.මේ පිළිබඳව පසුගිය ලේකම් රැස්වීමකදීද සාකච්ඡා කල බවත් මින් ඉදිරියට අනුමැතියට එවන විට නම් වශයෙන් අවශ්‍ය නොවන බව එහිදී පැවසූ බවත් සංඛ්‍යාවට අනුමැතිය ඉල්ලන ලෙසට පැවසූ බවත් ප්‍රකාශ කරන ලදී.එමෙන්ම සභාවට ඉදිරිපත් කිරීමේදී නම් වශයෙන් ඉදිරිපත් කිරීම ගැටළුවක් නොවන බවත් තවදුරටත් ප්‍රකාශ කරන ලදී.

නම් නොයවා සංඛ්‍යාව පමණක් යැවීම ගැටළුවක් නොවේදැයි ගරු මන්ත්‍රී එම්.එම්.ජිනේන්ද්‍ර විශ්වනාත් මංචනායක මහතා විමසා සිටින ලදී.

දහදෙනෙකුට අනුමැතියක් ගන්නේ නම් සංඛ්‍යාවට අනුමැතියක් ලබා දෙන බවත්,දෙදෙනෙකු ඉවත් වුවහොත් එයට දෙදෙනෙකුව සේවයට ගැනීමට හැකි බවත් මේ පිළිබඳව පැහැදිලි කරමින් ලේකම් මහතා පවසා සිටින ලදී.

මෙහිදී නිළධාරීන්ගේද වගකීමක් තිබෙන බවත්,දින වකවාණු පිළිබඳව සටහන් කර ගත යුතු බවත්,මෙය මුදල් වියදම් කිරීමේ ක්‍රමවේදය අනුව වැරදි බවත්,මෙහිදී ගැටළුවක් මතුවේදැයි තමන් නොදන්නා බවත් එසේ ඇතුවුනා හෝ නොවුනා මින් ඉදිරියට නිලධාරීන්ට කල් පසු නොකර දිනයටම ඒවා සිදු කරන ලෙසට දැනුම් දෙන ලෙසත් ගරු මන්ත්‍රී එම්.එම්.ජිනේන්ද්‍ර විශ්වනාත් මංචනායක මහතා ප්‍රකාශ කරන ලදී.

ගැටළුක් තිබේ නම් ලේකම් මහතා පවසාවියැයිද,වැටුප අප සේවකයින්ට ලබා දී ඇති බවත්,ආවරණ අනුමැතිය තිබෙන බවත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

පහලොස් දෙනෙකු සඳහා අනුමැතිය ලබා ගෙන ඉන් තුන් දෙනෙකු ඉවත් වී ගිය පසුව නැවතත් පහලොස් දෙනෙකුට අනුමැතිය යවන්නේ නම් එම ඉවත් වී ගිය තිදෙනාටද අනුමැතිය ලැබෙන බවත් ඔවුන්ගේ පඩියට කුමක් කරන්නේද යන වගකීම සභාව තුළ තිබෙන බවත්,නම් සහිතව යවන්නේ නම් එම ගැටළුව නොපැමිණෙන බවත්,එසේ නොමැති නම් එම පහලොස් දෙනාගේම පඩිය ගෙවූවා සේ සැලකිය හැකි බවත් ගරු මන්ත්‍රී එම්.එම්.ජිනේන්ද්‍ර විශ්වනාත් මංචනායක මහතා ප්‍රකාශ කරන ලදී.

එහිදී නම් චෙක්රෝලක් සෑදිය යුතු බවත් ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා ප්‍රකාශ කරන ලදී.

## 02. ගරු සභාපතිතුමාගේ විශේෂ නිවේදන

01. 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ රීති ප්‍රකාරව 2023 වර්ෂය සඳහා මුදල් හා ප්‍රතිපත්ති කාරක සභාවට කමිටු සාමාජිකයින් පත් කර ගැනීම සඳහා ගරු සභාපතිතුමා යෝජනා කරන ලදී.

කමිටු සඳහා ගියමස මහා සභාවේදීද සම්මත කල බව ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා ප්‍රකාශ කරන ලදී.

මුදල් කමිටුව විශේෂයෙන්ම ජනවාරි මසදී පත් කල යුතු බව පණතේ තිබෙන බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

තීරණ අංක 02

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ රීති ප්‍රකාරව 2023 වර්ෂය සඳහා මුදල් හා ප්‍රතිපත්ති කාරක සභාවේ සාමාජිකයින් ලෙස පහත සඳහන් ගරු මන්ත්‍රීවරුන් හා ගරු මන්ත්‍රීවරියන් පත් කිරීම සුදුසු බව ගරු සභාපතිතුමා විසින් යෝජනා කල අතර එම යෝජනාව ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා විසින් ස්ථිර කරන ලදී.ඒ අනුව ඒ සඳහා ගරු මහා සභාවේ ඒකමතිකව අනුමැතිය ලබා දෙන ලදී.

- ගරු සභාපති කේ.වී.සුසන්ත පෙරේරා මහතා - කාරක සභා සභාපති
- ගරු උපසභාපති ආර්.ඒ.නිලංක සඳකැල් මහතා - කාරක සභා සාමාජික
- ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා - කාරක සභා සාමාජික
- ගරු මන්ත්‍රී ඩබ්.ඇලෙක්ස් නිශාන්ත ප්‍රනාන්දු මහතා - කාරක සභා සාමාජික
- ගරු මන්ත්‍රී ඩබ්.ජෝන් බැප්ටිස් ප්‍රනාන්දු මහතා - කාරක සභා සාමාජික
- ගරු මන්ත්‍රී යූ.ජුඩ්.එම්මානුවෙල් මහතා - කාරක සභා සාමාජික
- ගරු මන්ත්‍රිනී ආර්.නිරෝෂා ජීවන්ති ප්‍රනාන්දු මහත්මිය - කාරක සභා සාමාජික
- ගරු මන්ත්‍රී කේ.නාමල් අනුරුද්ධ සිරිවර්ධන ප්‍රනාන්දු මහතා - කාරක සභා සාමාජික
- ගරු මන්ත්‍රී එල්.කේ.ජගත් ප්‍රියංකර මහතා - කාරක සභා සාමාජික
- ගරු මන්ත්‍රී සී.පී.සරත් වික්‍රමරත්න මහතා - කාරක සභා සාමාජික
- ගරු මන්ත්‍රී ඩබ්.ශිරෝන් ගාමිණී අසෝක ප්‍රනාන්දු මහතා - කාරක සභා සාමාජික
- ගරු මන්ත්‍රිනී එච්.එම්.සුදර්ශි භාග්‍යා කරුණාරත්න මෙනවිය - කාරක සභා සාමාජික
- ගරු මන්ත්‍රී ඩබ්.ඒ.ගෝධාභය වික්‍රමසිංහ මහතා - කාරක සභා සාමාජික

## 02. නිවාඩු අනුමත කිරීම

a) මහා සභාව සඳහා නොපැමිණෙන ගරු මන්ත්‍රීවරුන්ගේ හා ගරු මන්ත්‍රීවරියන්ගේ නිවාඩු අනුමත කිරීම.

තීරණ අංක 03

මහා සභා රැස්වීමට සහභාගී වීමට නොහැකි බව දන්වා නිවාඩු අයදුම්කර ඇති පහත නම් සඳහන් ගරු මන්ත්‍රීවරුන්ගේ හා ගරු මන්ත්‍රීවරියන්ගේ නිවාඩු අනුමත කිරීම සඳහා ගරු සභාපතිතුමා ඉදිරිපත් කල යෝජනාව ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා විසින් ස්ථිර කරන ලදුව ඒ සඳහා මහා සභාවේ ඒකමතික අනුමැතිය ලබා දීමට තීරණය කරන ලදී.

- ගරු මන්ත්‍රී එල්.කේ.ජගත් ප්‍රියංකර මහතා
- ගරු මන්ත්‍රී ඩබ්.ලෙනාඩ් දීමස් ප්‍රනාන්දු මහතා
- ගරු මන්ත්‍රී ඒ.රෙක්ෂි ප්‍රභාත් ප්‍රනාන්දු මහතා
- ගරු මන්ත්‍රී එල්.දිනේෂ් චන්දන පෙරේරා මහතා
- ගරු මන්ත්‍රිනී පී.එම්.ලිහිණි අනුත්තරා ප්‍රභාෂි මෙනවිය
- ගරු මන්ත්‍රිනී එම්.එම්.මේරි.වාලට් කුරේ මහත්මිය
- ගරු මන්ත්‍රී ටී.බී.ඩී.ඇන්ටනී කුමාර් මහතා
- ගරු මන්ත්‍රී එස්.එම්.සුදත් චන්දන මහතා
- ගරු මන්ත්‍රී වී.කේ.එම්.අසන්ත කුලසේකර මහතා

b) කාරක සභා සඳහා නොපැමිණි ගරු මන්ත්‍රීවරුන්ගේ හා ගරු මන්ත්‍රීවරියන්ගේ නිවාඩු අනුමත කිරීම.

තීරණ අංක 04

2022 දෙසැම්බර් මාස පැවති පහත සදහන් කාරක සභා සඳහා සහභාගී නොවූ පහත නම් සඳහන් ගරු මන්ත්‍රීවරුන්ගේ හා ගරු මන්ත්‍රීවරියන්ගේ නිවාඩු අනුමත කිරීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් ගෙන එන ලද යෝජනාව ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා විසින් ස්ථිර කරන ලදී. ඒ අනුව ඒ සඳහා මහා සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදී.

**2022 දෙසැම්බර් මස 02 වන දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කාරක සභාව**

| අ/අ | නම |
|---|---|
| 1. | ගරු උපසභාපති ආර්.ඒ.නිලංක සඳකැල් මහතා |
| 2. | ගරු මන්ත්‍රී ඩබ්.ඇලෙක්ස් නිශාන්ත ප්‍රනාන්දු මහතා |
| 3. | ගරු මන්ත්රිනී නිරෝෂා ජීවන්ති ප්රනාන්දු මහත්මිය |
| 4. | ගරු මන්ත්‍රී කේ.නාමල් අනුරුද්ධ සිරිවර්ධන ප්‍රනාන්දු මහතා |
| 5. | ගරු මන්ත්‍රී එල්.කේ.ජගත් ප්‍රියංකර මහතා |
| 6. | මන්ත්‍රී ඩබ්.ශිරෝන් ගාමිණි අසෝක ප්‍රනාන්දු මහතා |
| 7. | ගරු මන්ත්‍රිනී එච්.එම්.සුදර්ශි භාග්‍යා කරුණාරත්න මෙනවිය |

**2022 දෙසැම්බර් මස 08 වන දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කාරක සභාව**

| අ/අ | නම |
|---|---|
| 1. | ගරු උපසභාපති ආර්.ඒ.නිලංක සඳකැල් මහතා |
| 2. | ගරු මන්ත්‍රී ඩබ්.ශිරෝන් ගාමිණි අසෝක ප්‍රනාන්දු මහතා |

**2022 දෙසැම්බර් මස 13 වන දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කාරක සභාව**

| අ/අ | නම |
|---|---|
| 1. | ගරු උපසභාපති ආර්.ඒ.නිලංක සඳකැල් මහතා |
| 2. | ගරු මන්ත්‍රී ඩබ්.ඇලෙක්ස් නිශාන්ත ප්‍රනාන්දු මහතා |
| 3. | ගරු මන්ත්‍රී ඩබ්.ජෝන් බැප්ටිස් ප්‍රනාන්දු මහතා |
| 4. | ගරු මන්ත්‍රිනී ආර්.නිරෝෂා ජීවන්ති ප්‍රනාන්දු මහත්මිය |
| 5. | ගරු මන්ත්‍රී කේ.නාමල් අනුරුද්ධ සිරිවර්ධන ප්‍රනාන්දු මහතා |
| 6. | ගරු මන්ත්‍රී එල්.කේ.ජගත් ප්‍රියංකර මහතා |
| 7. | ගරු මන්ත්‍රී ඩබ්.ශිරෝන් ගාමිණි අසෝක ප්‍රනාන්දු මහතා |
| 8. | ගරු මන්ත්‍රිනී එච්.එම්.එස්.බී. කරුණාරත්න මෙනවිය |

**2022 දෙසැම්බර් මස 27 වන දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කාරක සභාව**

| | |
|---|---|
| 1. | ගරු උපසභාපති ආර්.ඒ.නිලංක සඳකැල් මහතා |
| 2. | ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා |
| 3. | ගරු මන්ත්‍රී ඩබ්.ජෝන් බැප්ටිස් ප්‍රනාන්දු මහතා |
| 4. | ගරු මන්ත්‍රිනී ආර්.නිරෝෂා ජීවන්ති ප්‍රනාන්දු මහත්මිය |
| 5. | ගරු මන්ත්‍රී කේ.නාමල් අනුරුද්ධ සිරිවර්ධන ප්‍රනාන්දු මහතා |
| 6. | ගරු මන්ත්‍රී එල්.කේ.ජගත් ප්‍රියංකර මහතා |
| 7. | ගරු මන්ත්‍රී ඩබ්.ශිරෝන් ගාමිණි අසෝක ප්‍රනාන්දු මහතා |
| 8. | ගරු මන්ත්‍රිනී එච්.එම්.එස්.බී. කරුණාරත්න මෙනවිය |

**2022 දෙසැම්බර් මස 30 වන දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කාරක සභාව**

| | |
|---|---|
| 1. | ගරු උපසභාපති ආර්.ඒ.නිලංක සඳකැල් මහතා |

| | |
|---|---|
| 2. | ගරු මන්ත්‍රී ඩබ්.ඇලෙක්ස් නිශාන්ත ප්‍රනාන්දු මහතා |
| 3. | ගරු මන්ත්‍රී එල්.කේ.ජගත් ප්‍රියංකර මහතා |
| 4. | ගරු මන්ත්‍රිනී ආර්.නිරෝෂා ජීවන්ති ප්‍රනාන්දු මහත්මිය |
| 5. | ගරු මන්ත්‍රී ඩබ්.ශිරෝන් ගාමිණී අසෝක ප්‍රනාන්දු මහතා |
| 6. | ගරු මන්ත්‍රිනී එච්.එම්.එස්.බී. කරුණාරත්න මෙනවිය |

**2022 දෙසැම්බර් 02 වන දින පැවති මාර්ග, ඉඩම් , ගොඩනැගිලි හා කාර්මික සේවා කාරක සභාව**

| අ/අ | නම |
|---|---|
| 1. | ගරු මන්ත්‍රී ඩබ්.ලෙනාඩ් දීමස් ප්‍රනාන්දු මහතා |
| 2. | ගරු මන්ත්‍රිනී නිරෝෂා ජීවන්ති ප්‍රනාන්දු මහත්මිය |
| 3. | ගරු මන්ත්‍රී ජී.කේ.අශේන් විමුක්ති ප්‍රනාන්දු මහතා |
| 4. | ගරු මන්ත්‍රී එල්.දිනේෂ් චන්දන පෙරේරා මහතා |
| 5. | මන්ත්‍රී ඩබ්.ශිරෝන් ගාමිණී අසෝක ප්‍රනාන්දු මහතා |
| 6. | ගරු මන්ත්‍රී එල්.සුසන්ත ශ්‍රිනාත් ප්‍රනාන්දු මහතා |

**2022 දෙසැම්බර් මස 01 වන දින පැවති පොදු පහසුකම් හා ආපදා කලමනාකරණ කාරක සභාව**

| අ/අ | නම |
|---|---|
| 1. | ගරු මන්ත්‍රී ඩබ්.ලෙනාඩ් දීමස් ප්‍රනාන්දු මහතා |
| 2. | ගරු මන්ත්‍රී එම්.එම්.ජිනේන්ද්‍ර විශ්වනාත් මංචනායක මහතා |
| 3. | ගරු මන්ත්‍රී ආර්.පී.අකිල ශිරංග රාජපක්ෂ මහතා |
| 4. | ගරු මන්ත්‍රී ඩබ්.ස්ටැන්ලි තිසේරා මහතා |
| 5. | ගරු මන්ත්‍රී ඩී.එල්.අමල් සුරංග මහතා |
| 6. | ගරු මන්ත්‍රිනී අයි.එච්.නයෝමි රමාලතා මහත්මිය |
| 7. | ගරු මන්ත්‍රී ටී.බී.ඩී.ඇන්ටනී කුමාර් මහතා |
| 8. | ගරු මන්ත්‍රී එස්.එම්.දර්ශන දිමුතු කුමාර සුහසිංහ මහතා |

**2022 දෙසැම්බර් මස 29 වන දින පැවති පරිසර සහ මහජන සෞඛ්‍ය පහසුකම් සංවර්ධන කාරක සභාව**

| | |
|---|---|
| 1. | ගරු මන්ත්‍රිනී නිරෝෂා ජීවන්ති ප්‍රනාන්දු මහත්මිය |
| 2. | ගරු මන්ත්‍රී කේ.එල්.චමින්ද කුමාර කරුණානායක මහතා |
| 3. | ගරු මන්ත්‍රී ඩී.එල්.අමල් සුරංග මහතා |
| 4. | ගරු මන්ත්‍රී කේ.නොඑල් සුදත් ජානක පෙරේරා මහතා |
| 5. | ගරු මන්ත්‍රී එච්.ඒ.ක්ලීටස් පෝල් පෙරේරා මහතා |
| 6. | ගරු මන්ත්‍රී වී.කේ.එම්.අසන්ත කුලසේකර මහතා |

**2022 දෙසැම්බර් මස 01 වන දින පැවති පොදු පහසුකම් හා ආපදා කලමනාකරණ කාරක සභාව**

| | |
|---|---|
| 1. | ගරු මන්ත්‍රී එල්.කේ.ජගත් ප්‍රියංකර මහතා |
| 2. | ගරු මන්ත්‍රී ඩබ්.සුරේන් ඇන්ටන් ශ්‍රීනාත් ප්‍රනාන්දු මහතා |
| 3. | ගරු මන්ත්‍රී එස්.එම්.දර්ශන දිමුතු කුමාර සුහසිංහ මහතා |

03. රාජ්‍ය සේවයේ 29 වසරක සේවා කාලයකින් පසුව 2022-12-31 වන දින ඒ.එෆ්.පී.ප්‍රනාන්දු ලේකම් මහතා රාජකාරී ජීවිතයෙන් සමුගත් බවත්, එතුමා විසින් අප සභාවට කල මෙහෙවරට සියළුම මන්ත්‍රී මණ්ඩලයේ ස්තූතිය පුද කරන අතර වෙන්නප්පුව බල ප්‍රදේශයේ ජනතාව වෙනුවෙන් සිදු කල මෙහෙවරටද විශේෂයෙන්ම ස්තූතිය පුද කරන ලදී.

04. වෙන්නප්පුව බල ප්‍රදේශයට අයත් එක් එක් කොට්ඨාස වල අඩු ආදායම්ලාභී රෝගීන් සඳහා වෛද්‍යාධාර මුදල් ලබාදීමට පසුගිය දින හැකි වූ බවත් ඒ සඳහා සහයෝගය ලබා දුන් සියළුම දෙනාට ස්තූතිය පුද කරන ලදී.

05. වෙන්නප්පුව ප්‍රාදේශීය සභාව GPS ක්‍රමවේදය යටතේ වැටුප් සකස් කිරීම මේ වන විට ආරම්භ කර ඇති බවත් මේ සම්බන්ධයෙන් සහය ලබා දුන් හලාවත නගර සභාවේ කලමනාකරණ සේවා නිලධාරී එම්.ඒ.එෆ්.අස්ලා මහත්මියට ස්තූතිය පුද කරන අතර මෙම කටයුතු වෙනුවෙන් සහයෝගය ලබාදුන් අප සභාවේ සියළුම නිලධාරීණ්ටද ස්තූතිය පුද කරන ලදී.

06. 2022 වර්ෂයේ නත්තල් උත්සවයට සමගාමීව වෙන්නප්පුව බල ප්‍රදේශයට අයත් අඩු ආදායම්ලාභී පවුල් 250 සඳහා වියළි ආහාර ද්‍රව්‍යය බෙදා දීමක් ප්‍රධාන කාර්යාල පරිශ්‍රයේ සහ උප කාර්යාල වලදී සිදු කල බවත් ඒ සඳහා සහයෝගය ලබා දුන් සියළුම දෙනාට ස්තූතිය පුද කරන ලදී.

07. 2023 වර්ෂය සඳහා වැඩ ආරම්භ කිරීම 2023-01-02 වන දින සිදු කල අතර එදිනම නව ලේකම් මහතාගේ වැඩ භාර ගැනීමේ කටයුතුද සිදු වූ බවත් එම සියළුම කටයුතු සඳහා සහයෝගය ලබා දුන් සියළුම දෙනාට ස්තූතිය පුද කරන ලදී.

08. ඉදිරියේදී ඇතිවිය හැකි ආහාර අර්බුදයට පෙර සූදානමක් ලෙස සහ බල ප්‍රදේශයේ තෝරාගත් ගොවීන් සඳහා අතිරේක ආහාර බෝග බීජ බෙදා දිමෙන් අනතුරුව වගා කල ගොවින් අස්වනු නෙලීම පසු විපරම් කිරීම සිදු කරන ලදී. එම වැඩ කටයුතු සඳහා සහයෝගය ලබා දුන් සියළුම දෙනාට ස්තූතිය පුද කරන ලදී.තමන් දැනුවත්ව ගොවිපලවල් 100 පමණ ඇති කර ඇති බවත්,මේ වන විට එලදාව නෙළා ගන්නා බවත් ප්‍රකාශ කරන ලදී.ඉදිරියේදීද මේ සඳහා අවධානය යොමු කර කටයුතු සිදු කරමුයැයිද ප්‍රකාශ කරන ලදී.

09. ජනවාරී මස 31 වන දින දක්වා 10% වට්ටමක් වරිපනම් බදු සඳහා ලබා දෙන බව දැනුම් දෙන ලදී.මෙය මුහුණු පොතේද සඳහන් කර ඇති බවත් ප්‍රකාශ කරන ලදී.එය පණිතින්ම පැමිනෙන බවත් ප්‍රකාශ කරන ලදී.

10. අද දින මහා සභා රැස්වීමෙන් පසුව මුදල් කමිටුව පැවැත්වෙන බව දැනුම් දෙන ලදී.

11. 2022 දෙසැම්බර් මස පහත සඳහන් මාර්ග වල වලවල් ප්‍රිමික්ස් අතුරා සංවර්ධනය කිරීමට හැකි වූ බවත් ඒ සඳහා සහයෝගය ලබා දුන් සියළුම දෙනාට ස්තූතිය පුද කරන ලදී.

- සිංගක්කුලිය කළුවච්චිමුල්ල මාර්ගය
- උල්හිටියාව සේවියර් මාවත
- බෝලාන තඹරවිල කමලසිරි මාවත
- බෝලාන තඹරවිල පල්ලිය පාර
- ලුණුවිල පන්සල පාර
- කම්මල බලකොටු මෝල පාර
- ලුණුවිල පන්සල අසල මාර්ගය අධියර 1 හා 2
- දංකොටුව කාසිසෙට්ටිවත්ත මාර්ගය
- මැල්ලව කා◌ෘස්වත්ත පාර අධියර 1,2 හා 3
- හාල්දඬුවන දේවාල අසල පාර
- කිරිමැටියාන පාසල් මාවත
- වෙන්නප්පුව ගෝල්ඩන් රීච් හෝටලය අසල පාර
- බණ්ඩිරිප්පුව ගාලවත්ත ප්‍රධාන පාර

12.තමන් මෙම සභා වාරයට අංශ ප්‍රධානීන් කැඳවූයේ ගැටළුවක් පැමිණි පසුව එම ගැටළුව කාරක සභා අවස්ථාව බවට පත් කර නිරාකරණය කර ගැනීමට බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.දිගටම ඔවුන්ව කැඳවීමට තමන් බලාපොරොත්තු වන බවත් ප්‍රකාශ කරන ලදී.

කාරක සභා සඳහාද නිලධාරීන්ව මෙලෙස ගෙන්වන ලෙස ගරු මන්ත්‍රී එම්.එම්.ජිනේන්ද්‍ර විශ්වනාත් මංචනායක මහතා පවසා සිටින ලදී.

එය ලේකම් මහතා සොයා බලාවියැයි ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

පරිසර කමිටුවටද අනෙක් ආයතන වල නිලධාරීන් සහභාගි වන බවත්,නමුත් සභාවේ නිලධාරීන් සහභාගී නොවන බවත් ගරු මන්ත්‍රී ඩබ්.ජෝන් බැප්ටිස් ප්‍රනාන්දු මහතා ප්‍රකාශ කරන ලදී.

ඉදිරියේදී ලේකම් මහතා ඒවාසොයා බලා නිලධාරීන් එවාවියැයි ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

## 03.යථා පරිදි කල් දී ඇති යෝජනා

### a. ගරු සභාපතිතුමාගේ යෝජනා

i. වෙන්නප්පුව ශ්‍රීමත් ඇල්බට් ඇෆ් පීරිස් ක්‍රීඩාංගණ සංකීර්ණයේ 2023 වර්ෂය සඳහා අනුමත වූ ගාස්තු සංශෝධනයට ගරු මහා සභාවේ අනුමැතිය ලබා දීම සුදුසු බවට ගරු සභාපතිතුමා ගරු මහා සභාවට යෝජනා කරන ලදී.

බල ප්‍රදේශයේ පාසල් වල විදුහල්පතිවරුන් විසින් පිහිණුම් තටාකයේ ගාස්තු සම්බන්ධයෙන් ඉල්ලීම් කර තිබෙන බවත්,තමන් සමඟ කතා කල බවත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.අපේ දරුවන් වෙනුවෙන් මෙම කටයුතු කලමනාකරණය කර ගත යුතු බවත්,තව තවත් පිහිණුම් තටාකය විවෘත කර වැඩියෙන් දරුවන් ගෙන්වාගත යුතු බවත් එය සභාව මඟින් ඉටුවිය යුතු බවත් ප්‍රකාශ කරන ලදී.පිහිණුම් තටාකය භාවිතා කරන පිරිස වැඩිවුවහොත් අවශ්‍ය වියදම සපුරාගෙන ගාස්තුව අඩු කිරීමට හැකි වන බවත් ප්‍රකාශ කරන ලදී.සියළු දෙනාගෙන්ම විශේෂයෙන්ම ඉල්ලීමක් කරන බවත් මේ මොහොතේ ජනතාව ජීවන අරගලයෙන් සිටින බවත්,දරුවන්ටද ක්‍රීඩාවෙන් ඉවත් වන ලෙසට දෙමාපියන් පවසන බවත් ප්‍රකාශ කරන ලදී.පිහිණුම් තටාකය මෙන්ම ගෘහස්ථ ක්‍රීඩාංගණයේ බැඩ්මින්ටන්ද සෙල්ලම් කරනුයේ පාසල් වල දරුවන් බවත්,ඒවායෙහි ගාස්තුව යම් ප්‍රමාණයක් අඩු කරමුයැයිද,පිහිණුම් තටාකයේ ගාස්තුව රු.150ක් පමණ කරමුයැයිද,වියදම සපුරා ගැනීමට නොහැකි වුවත් දරුවන් වෙනුවෙන් එය සිදු කරමුයැයිද මාස 3ක් එය සිදු කර බලමුයැයිද ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

ගරු මන්ත්‍රී කේ.නාමල් අනුරුද්ධ සිරිවර්ධන ප්‍රනාන්දු මහතා ගරු සභාපතිතුමාගෙන් අවසර ගැනීමෙන් පසුව පසුගිය කාලයේ විශාල ලෙස නඩත්තු කටයුතු සඳහා වියදම වැඩි වූ බවත්, එබැවින් තීරණයක් ගෙන මෙම කටයුතු පවත්වාගෙන යාමට ගාස්තුව වැඩි කල බවත්,සභාව පසින් ගත් විට එය විශාල මුදලක් නොවන බවත් මන්ද ඊටත් වඩා මුදලක් වියදම් කරන බවත් ප්‍රකාශ කරන ලදී.නමුත් ගරු සභාපතිතුමා පැවසූ පරිදි මාස තුනක කාලයකට මෙම ගාස්තුව අඩු කිරීමට තමන් එකඟ වන බවත්,කණ්ඩායම් වශයෙන් දරුවන් ගෙන සලකා බැලීමක් කරමුයැයි තමන් යෝජනා කරන බවත්,උදාහරණයක් ලෙස වෙන්නප්පුව ශාන්ත ජෝශප් වාස් විද්‍යාලයේ සිසුන් 20 දෙනෙකුගේ කණ්ඩායමක් ඉදිරිපත් කරන ලෙසට විදුහල්පතිට පවසන ලෙසත් එවිට ගාස්තුව අඩුකර දිය හැකි බවත් ප්‍රකාශ කරන ලදී.එවිට පිහිණුම් තටාකය භාවිතා කරන මොහොතට යම් පිරිසක් එය භාවිතා කරන බැවින් අදාල වියදම එමඟින් සපුරා ගත හැකි බවත් ,හුදකලාව නොව කණ්ඩායම් ලෙස ඉදිරිපත් වුවහොත් සභාව පසින් මෙන්ම දරුවන්ගේ පසින්ද එයට සාධාරණයක් ලබෙන බවත් ප්‍රකාශ කරන ලදී.

එම යෝජනාව හොඳ බවත්,එය සාකච්ඡා කර අධීක්ෂණය කර පසුව මහා සභාවට දමා අනුමත කර ගනිමුයැයි ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

වෙන්නප්පුව ශාන්ත ජෝශප් වාස් විද්‍යාලය මඟින් ඉදිරිපත් කර ඇති ලිපියේ " අප පාසලේ පිහිණුම් ක්‍රීඩාවේ නිරත වන දරුවන් 50කට ආසන්න ප්‍රමානයක් සිටින බැවින් මෙම තත්ත්වය සලකා බලා පිහිණුම් තටාක ගාස්තු වැඩි නොකොට දරුවන් සදහ සහනදායී වැඩපිළිවෙලක් සකස් කර දෙන මෙන් කාරුණිකව ඉල්ලා සිටිමි. තවද, ඉදිරියේදී තවත් නවක සිදුන් පිහිණුම් ක්‍රීඩාවේ යෙදවීමට අප කටයුතු කරගෙන යන බව ද දන්වනු කැමැත්තෙමි " ලෙස සඳහන් වන බවත්,ඔවුන්ගේ එම ප්‍රකාශයට ගරු මන්ත්‍රී කේ.නාමල් අනුරුද්ධ සිරිවර්ධන ප්‍රනාන්දු මහතා විසින් පැවසූ යෝජනාව සහයෝගයක් බවත් ගරු මන්ත්‍රී සී.පී.සරත් වික්‍රමරත්න මහතා ප්‍රකාශ කරන ලදී.

එය 20 කණ්ඩායම් වලට කැඩු විට ඉතිරි 10 දෙනාටද තවත් 10 දෙනෙකු එකතු කර ඉදිරිපත් කිරීමට පාසල උනන්දු වන බවත් ගරු මන්ත්‍රී කේ.නාමල් අනුරුද්ධ සිරිවර්ධන ප්‍රනාන්දු මහතා ප්‍රකාශ කරන ලදී.

මෙම යෝජනාව හොඳ බවත්,එය අදම ක්‍රියාත්මක කරන ලෙසත් ගරු මන්ත්‍රී සී.පී.සරත් වික්‍රමරත්න මහතා ප්‍රකාශ කරන ලදී.

පාසලින් ක්‍රීඩාවක් කරන ලෙසට දරුවන්ට දැනුම් දෙන බවත්,දරුවන් විසින් විවිධ ක්‍රීඩා තෝරා ගන්නා බවත්, එබැවින් කණ්ඩායම් ලෙස නොව පාසලින් පිහිණුම් ක්‍රීඩාව කරන දරුවන් කොපමණ සිටීදැයි වාර්තාවක් ගන්නා ලෙසත් දවස් 7ම පිහිණුම් තිබෙන බවත්,සවසත් උදේ වරුවෙත් පිහිණුම් කටයුතු සිදු කරන බවත්, පුහුණුකරුවන් වෙනස් නොවුවත් දරුවන් ඔවුන්ට හැකි අවස්ථාවේදී එයට සහභාගී වන බවත් එවිට කණ්ඩායමක් එකතු වී යා නොහැකි බවත් ගරු මන්ත්‍රී එම්.එම්.ජිනේන්ද්‍ර විශ්වනාත් මංචනායක මහතා ප්‍රකාශ කරන ලදී.

එක් එක් කණ්ඩායම් වලට පුහුණුකරුවන් සිටින බවත්, පාසල එක වුවත් පුහුණු කරුවන් වෙනස් වන බවත් ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා ප්‍රකාශ කරන ලදී.එබැවින් විද්‍යාලය අනුමත කරන කඩදාසියක් සභාවේ ලිපි ගොනුවට ඇතුළත් කර ගන්නා ලෙසත් ප්‍රකාශ කරන ලදී.

මෙය බල ප්‍රදේශයට සීමා විය යුතු බවත් ගරු මන්ත්‍රී එම්.එම්.ජිනේන්ද්‍ර විශ්වනාත් මංචනායක මහතා ප්‍රකාශ කරන ලදී.

කලින් තීන්දුව ගෙනද 6 මාසයක් ගොස් නොමැති බවත්,එබැවින් බල ප්‍ර දේශයේ දරුවන්ගේ සුභ සිද්ධිය උදෙස කටයුතු කරමුයැයි ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා ප්‍රකාශ කරන ලදී.

පාසල් සීමාවක් නොදමා මෙම කටයුතු සිදු කරමුයැයි ගරු මන්ත්‍රී ඩබ්.ඇලෙක්ස් නිශාන්ත ප්‍රනාන්දු මහතා ප්‍රකාශ කරන ලදී.

අප බල ප්‍රදේශයේ දරුවෙකු ශිෂ්‍යත්වය පාස් වී පිට පළාතක පාසලකටද යා හැකි බවත් ඒවාද සලකා බැලිය යුතු බවත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

මෙහිදී දරුවන්ව පිහිණීමට යෙදවීමට පෙර සහතික පරීක්ෂා කරමින් සිටීමට සිදු වන බවත්,පුහුණුකරුට යම් කාලයක් පමණක් ලබා දී තිබෙන බවත්,ඒ අතර මේවා පරීක්ෂා කරමින් කටයුතු කිරීමට නොහැකි බවත් එබැවින් මෙම මාස 3ට අප බල ප්‍රදේශයේ පාසල් වල දරුවන්ට පමණක් එම ගාස්තු සංශෝධනය සිදු කරමුයැයි ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා ප්‍රකාශ කරන ලදී.

බල ප්‍රදේශයේ පාසල් වලින් ඉල්ලීම් කර ඇති බැවින් එම පාසල් කීපයෙන් ලිපි කීපයක් ගනිමුයැයිද ඊට අමතරව නැවත ලිපියක් පැමිණියහොත් ඊළඟ මහා සභාවට එය ඉදිරිපත් කරමුයැයිද ගරු මන්ත්‍රී කේ.නාමල් අනුරුද්ධ සිරිවර්ධන ප්‍රනාන්දු මහතා ප්‍රකාශ කරන ලදී. පාසල් වලින් නම් කරන පිහිණුම් ක්‍රීඩාවේ යෙදෙන දරුවන්ට මෙම සහනය ලබාදෙමුයැයිද ප්‍රකාශ කරන ලදී.

ඕස්ට්‍රේලියානු පදනම සමඟ ක්‍රීඩා කරන කණ්ඩායම සමඟ ලුනුවිල අනුරුද්ධ පාසලින් දරුවන් 100 පමණ සිටි බවත්,වෙන්නප්පුව ශාන්ත ජෝෂප් වාස් විද්‍යාලයේ දරුවන් 80 පමණ සිටි බවත් නමුත් මෙම ලිපිය ක්‍රමයට එය නොතිබූ බවත්,එලෙස විවිධ කණ්ඩායම් එක් එක් විෂය පථයට පුහුණු වීම් සඳහා ගෙනෙන බවත් ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා ප්‍රකාශ කරන ලදී.

ගරු මන්ත්‍රී ඩී.නිමල් අරුණ ශාන්ති විජේතුංග මහතා ගරු සභාපතිතුමා ඇතුළු සියළුම දෙනාගෙන් අවසර ගැනීමෙන් පසුව ප්‍රතිපක්ෂයේ මන්ත්‍රීවරයෙකු ලෙස මේ පිළිබඳව තමන්ද අදහසක් ඉදිරිපත් කිරීමට කැමති බව ප්‍රකාශ කරන ලදී.ප්‍රා දේශීය සභාව යනු උපතේ සිට මරණය දක්වා සේවා සපයන ස්ථානයක් බවත්,විශේෂයෙන්ම මෙම දරුවන්ගේ ප්‍රශ්නයේදී අප සංවේදී විය යුතු බවත්,ගරු සභාපතිතුමාගේ වචන වලින්ම ගරු සභාපතිතුමා පැවසූ පරිදි රට අගාදයකට වැටී සිටින මේ මොහොතේ දරුවන්ගේ දෙමාපියන් අධික ජීවන බරකින් මිරිකී සිටින බවත් ප්‍රකාශ කරන ලදී. ගරු සභාපතිතුමා ද මෙම ගැටළුවේදී වියදම් අධික බැවින් දෙමාපියන් විසින් බොහෝ දරුවන්ව පුහුණුවීම වලට නොයවන බව පැවසූ බවත් එබැවින් මෙම පිහිණුම් තටාකය සම්බන්ධයෙන් දරුවන්ගේ ප්‍රශ්නයේදී මෙම ගැටළුව නූල් බෝලයක් කර නොගන්නා ලෙසත් ඉල්ලා සිටින ලදී. මෙම සහනය මාස තුනකට ලෙස නොව අප

රට මැදි ආදායම් රටක් බවට පත් වන තෙක් මෙය ක්‍රියාත්මක කරමුයැයිද යෝජනා කරන ලදී. මොන පාසලින් පැමිණියත් මේ අපගේ දරුවන් බැවින් අප ආත්මාර්ථකාමී නොවී සීමා මායිම් නොතබා ඒවා පිළිබඳවද සැලකිලිමත් වෙමින් කටයුතු කරන ලෙසත් ප්‍රකාශ කරන ලදී.මෙම බරපැණ එම ලැබෙන ආදායමින් දරාගැනීමට නොහැකි නම් අප සභාව මඟින් යම් මුදලක් ඒ සඳහා ලබා දෙමුයැයිද යෝජනා කරන ලදී.මේ සියල්ලටම වඩා දරුවන්ගේ ක්‍රීඩාව නැංවීමට අප ඇපකැප විය යුතුයැයිද වැඩිදුරටත් ප්‍රකාශ කරන ලදී.සෞඛ්‍ය සම්පන්න දරු පරපුරක් අප බිහි කල යුතු බවත්,පිහිණීමේදී අප සිතන සෑම දෙයක්ම ඉටු වන බැවින් මෙම ගරු සභාවෙන් මෙම ප්‍රශ්නය කෙරෙහි වඩාත් සංවේදී වී එම අදාල ක්‍රියාමාර්ග ගන්නා ලෙස ඉල්ලමින් තම අදහස් ඉදිරිපත් කිරීම අවසන් කරන ලදී.

- ගරු මන්ත්‍රී බී.ඒ.එස්.ශාන්ත පෙරේරා මහතා මෙම අවස්ථාවේදීසභා ශාලාවෙන් පිටව යන ලදී.(පෙ.ව.11.30)

පැය දෙකකට රු.150.00ක මුදල දරුවන් සඳහා ලබා ගනිමුයැයිද වැඩිහිටියන්ට රු.300.00ක මුදලක් ලෙස ලබා ගනිමුයැයිද ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී. මුදල් ඉතිරි කර බැංකු ගත කර තේරුමක් නොමැති බවත්,ජනතාවට සහන ලබා දී ඔවුන්ගේ වැඩ කටයුතු ඉටු කර දී අවංකව මුදල් ඉතිරි කල යුතු බවත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.දරුවන්ගේ උන්නතිය පිපිිබඳව කතාකිරීම පිළිබඳව සියළුම දෙනාට ස්තූතිය පුද කරන ලදී.

| |
|---|
| තීරණ අංක 05 |
| වෙන්නප්පුව ශ්‍රීමත් ඇල්බට් ඇෆ් පීරිස් ක්‍රීඩාංගණයේ පිහිණුම් ක්‍රීඩාවෙහි නිරත වන දරුවෙකු සඳහා රු.150.00ක මුදලක්ද, වැඩිහිටියෙකු සඳහා රු.300.00ක මුදලක්ද ගාස්තුව සංශෝධනය කර ලබා ගැනීම සුදුසු බවට ගරු සභාපතිතුමා යෝජනා කල අතර එම යෝජනාව ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා විසින් ස්ථිර කරන ලදී. ඒ අනුව ඒ සඳහා මහා සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදී. |

ii. 2023 වර්ෂය සඳහා පුස්තකාල උපදේශක කමිටුව පත් කිරීමට ගරු මහා සභාවේ අනුමැතිය ලබා දීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් යෝජනා කරන ලදී.

| |
|---|
| තීරණ අංක 06 |
| 2023 වර්ෂය සඳහා පුස්තකාල උපදේශක කමිටුව සඳහා පහත නම් සඳහන් පුද්ගලයින් පත් කිරීම සුදුසු බවට **ගරු සභාපතිතුමා යෝජනා කල අතර එම යෝජනාව** ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා විසින් ස්ථිර කරන ලදී. ඒ අනුව ඒ සඳහා මහා සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදී. |
| • මැල්කම් ෆෝන්සේකා මහතා<br>• ටී.බී.අරංගල්ල මහතා<br>• ඩේවිඩ් වික්‍රමසිංහ මහතා<br>• වසන්ත සේනානායක මහතා<br>• අයිරාංගනී පෙරේරා මහත්මිය<br>• රුවිනි තුෂාරි ප්‍රනාන්දු මහත්මිය<br>• විමලා ජයසුන්දර මහත්මිය<br>• එම්.කේ.යූ.වීරසිංහ මහතා |

iii. වෙන්නප්පුව ප්‍රධාන පල්ලිය පිටුපස දිවෙන (විද්‍යාල මාවත) මාර්ගය පුළුල් කිරීමේදී පාරට පවරාගත් ඉඩම් කොටස සඳහා තක්සේරු මුදල ගෙවීමට අනුමැතිය ලබා ගැනීමට අදාල යෝජනාව ගරු සභාපතිතුමා විසින් ගරු මහා සභාවට ඉදිරිපත් කරන ලදී.

මෙම ලිපිය ඊ්යේ දිනයේදී තම අතට ලැබුණ බවත්,එබැවින් න්‍යාය පත්‍රයට ඇතුල් කිරීමට නොහැකි වූ බවත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.එම මාර්ගය පළල් කිරීමට එම අසල ගුරුතුමියකගේ ඉඩමෙන් කොටසක් ගත් බවත්,එතුමිය හදිසියේ අභාවප්‍රාප්ත වී ඇති බවත්,එතුමියට සාධාරණයක් කරන බව තමන් මින් පෙර පවසා තිබූ බවත් එබැවින් රජයේ තක්සේරුව යටතේ එය ලබා දීම සුදුසු බවත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.එය සභාවේ පාරක් බවත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

| |
|---|
| තීරණ අංක 07<br>වෙන්නප්පුව ප්‍රධාන පල්ලිය පිටුපස දිවෙන (විද්‍යාල මාවත) මාර්ගය පුළුල් කිරීමේදී පාරට පවරාගත් ඉඩම් කොටස(පර්චස් 01.5) සඳහා තක්සේරු මුදල වන රු.500,000.00ක මුදල අදාල පාර්ශවය වෙත ගෙවීම සුදුසු බවට ගරු සභාපතිතුමා යෝජනා කල අතර එම යෝජනාව ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා විසින් ස්ථිර කරන ලදී. ඒ අනුව ඒ සඳහා මහා සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදී. |

මෙම යෝජනාවත් සමඟම තමන්ටද යම් අදහසක් ඉදිරිපත් කිරීමට තිබෙන බව ගරු උපසභාපති ආර්.ඒ.නිලංක සඳකැල් මහතා ප්‍රකාශ කරන ලදී. කිරිමැටියාන පුස්තකාලය අයිනෙන් තිබෙන බැම්ම ඉවත් කර පිටුපස ඉඩමට යන මාර්ගය ලබා දෙන ලෙසට උසාවි නියෝගයක් තිබෙන බවත් එය ඉක්මනින් ඉවත් කරන ලෙසත් මන්ද එය ගමේ විශාල ගැටළුවක් වී ඇති බවත් තමන්ටද එය විශාල පීඩනයක් බවත් ප්‍රකාශ කරන ලදී.

එය මාර්ගය ලබාදෙන ලෙසට වැඩ අධිකාරී මහතාට නියෝග කර ඇති බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

එසේ නම් හෙට දිනයේදී එය සිදු කර අවසන් කරමුයැයි ගරු උපසභාපති ආර්.ඒ.නිලංක සඳකැල් මහතා ප්‍රකාශ කරන ලදී.

- ගරු සභාපතිතුමාගේ හා ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතාගේ යෝජනා ස්ථිරත්වයෙන් මහා සභා අවස්ථාව කාරක සභා අවස්ථාවක් බවට පත් කර වැඩ අධිකාරී මහතාට මේ පිළිබඳව සභාව දැනුවත් කිරීම සඳහා අවස්ථාව සලසා දෙන ලදී.

වැඩ අධිකාරී මහතා ගරු සභාපතිතුමා ඇතුළු සියළුම දෙනාගෙන් අවසර ගැනීමෙන් පසුව එහි ගැටළුවක් තිබෙන බවත්,පොළ පසින් එම බැම්ම තිබෙන බවත් එහි තිබෙන කාණුව වැසිය යුතු බවත් ප්‍රකාශ කරන ලදී.

එම මාර්ගය යම් විට ඔවුන් භාවිතා නොකිරීමටද ඉඩ තිබෙන බවත්,නමුත් අප විසින් ක්‍රියාත්මක වීමත් නොමැති බැවින් එය සිදු කරමුයැයි ගරු උපසභාපති ආර්.ඒ.නිලංක සඳකැල් මහතා ප්‍රකාශ කරන ලදී. පුස්තකාලයේ තාප්පයද අළුත්වැඩියා කල යුතු බැවින් එබැවින් ඒවා සමඟ මෙම කටයුත්ත අප ආරම්භ කර ඇති බවට ඔවුන්ට පණිවිඩයක් ලබා දිය හැකි බවත් ප්‍රකාශ කරන ලදී.

මෙම ගැටළු පිලිබඳව වාර්තාවක් ඉදිරිපත් කර තිබේදැයි ගරු මන්ත්‍රී කේ.නාමල් අනුරුද්ධ සිරිවර්ධන ප්‍රනාන්දු මහතා විමසා සිටින ලදී.

ඒ සඳහා වාර්තාවක් ගන්නා ලෙස ගරු මන්ත්‍රී සී.පී.සරත් වික්‍රමරත්න මහතා ප්‍රකාශ කරන ලදී.

ගරු උපසභාපති ආර්.ඒ.නිලංක සඳකැල් මහතා සමඟ ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතාද සම්බන්ධ වී මෙම කටයුතු අවසන් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

තමන් ද මෙය නිරීක්ෂණයට ගිය බවත්, එම අවස්ථාවේදී පුස්තකාල තරඟ තිබෙන බැවින් මෙය කඩා ඉවත් කිරීමට නොහැකි බව පවසා තිබූ බවත් ගරු මන්ත්‍රී කේ.එල්.චමින්ද කුමාර කරුණානායක මහතා ප්‍රකාශ කරන ලදී.

තරඟ පසුව කරමුයැයිද,මෙය උසාවි නියෝගයක් බැවින් එම නියෝගය නොසලකා හැරීමක් බවට පත් වන බවත් පවසමින් හෙට දිනයේදී මෙම කටයුත්ත සිදු කරමුයැයි ගරු උපසභාපති ආර්.ඒ.නිලංක සඳකැල් මහතා ප්‍රකාශ කරන ලදී.

මේ සඳහා වාර්තාවක් ගෙන කර්මාන්ත කමිටුවට යොමු කරන ලෙසද ගරු මන්ත්‍රී සී.පී.සරත් වික්‍රමරත්න මහතා ප්‍රකාශ කරන ලදී.

උසාවි නියෝගය ලිපි ගොණුවට ගෙන වැඩ අධිකාරි මහතා ලවා එම මාර්ගය අවශ්‍යා ප්‍රමාණය සටහන් කරගෙන, වැසිකිළිය වහලයේ ගැටළුවක් තිබෙන බවත් මේ සියල්ල සලකා බලා ඒ සඳහා drawing එකක් ඇඳ අවසන් කිරීම සුදුසු බවට ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා ප්‍රකාශ කරන ලදී.

අඩුම තරමින්drawing එක අඳින තෙක් මෙම වැඩ කටයුතු ආරම්භ කරමුයැයිද,එම පිරිසට මෙම කටයුත්ත සිදු වන බවට පණිවිඩය දීමට අවශ්‍ය බවත්,මෙහි වගඋත්තර කරුවන් වීමට සිදු වනුයේ තමාට හා ගරු සභාපතිතුමාට බවත් එය උසාවි නියෝගයක් බැවින් හෙට දින මෙම කටයුතු ආරම්භ කරමුයැයිද ගරු උපසභාපති ආර්.ඒ.නිලංක සඳකැල් මහතා ප්‍රකාශ කරන ලදී.

iv. සෙන්දිරියාමුල්ල කොම්පෝස්ට් අංගණයේ අධියර 03හි ඉදි කිරිම් සඳහා රු.9,893,273.11ක ඇස්තමේන්තුව අනුමත කිරීමට අදාල යෝජනාව ගරු සභාපතිතුමා විසින් ගරු මහා සභාවට ඉදිරිපත් කරන ලදී.

අද වන විට සම්පූර්ණ මුදල කොළඹින් ලැබී ඇති බවත්,මෙය අප ලබා ගත් ජයග්‍රහණයක් බවත්,මෙහිදී තුන්වන හා හතර වන අධියර යටතේ කොන්ක්‍රීට් එක දැමීමට හා වහළ සම්පූර්ණ කිරීමට ඇස්තමේන්තු ලැබී ඇති බවත් මේ සඳහා අනුමැතියක් ලබාදෙන ලෙසත් ඉන්පසුව කර්මාන්ත කමිටුවේදී මේ පිළිබඳව සාකච්ඡා කරන ලෙසත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

මෙහි මුදල පිලිබඳව හා මෙම කටයුතු පිළිබඳව ගරු මන්ත්‍රීවරුන් විසින් තොරතුරු විමසා සිටින ලදී,

- ගරු සභාපතිතුමාගේ හා ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතාගේ යෝජනා ස්ථිරත්වයෙන් මහා සභා අවස්ථාව කාරක සභා අවස්ථාවක් බවට පත් කර වැඩ අධිකාරී මහතාට මේ පිළිබඳව සභාව දැනුවත් කිරීම සඳහා අවස්ථාව සලසා දෙන ලදී.

සීමිත මිල කැඳවීම අනුව ලක්ෂ 100 කොටස් බැගින් මෙය බෙදා ඇති බවත්,තුන්වන අධියරයට වහළය දැමුවද අවසන් කණු පේළි අතර වහලය වැසීමට නොහැකි වන අන්දමින් ලක්ෂ 100 අවසන් වන බවත් එවිට හතරවන අධියරය යටතේ අවසන් කණු පේළි අතර තහඩු ගැසීමට හා බිමට කොන්ක්‍රීට් දමා විදුලිය ලබා ගැනීමට සිදු වන බවත් ප්‍රකාශ කරන ලදී.

තමන් පැවසූ සියළු දේම අද වන විට ඉෂ්ඨ කර දී ඇති බවත්,මෙම මුදල්ද ප්‍රධාන ඉංජිනේරු මහතා ඔවුන්ව විශ්වාස කර මෙම කටයුතු සිදු කල බැවින් පලාත් පාලන අමාත්‍යාංශයෙන් ලබා දෙන බව පැවසූ බවත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

මේ වන විට කොපමණ මුදලක් ලැබී තිබේදැයි ගරු මන්ත්‍රී ඩබ්.ඇලෙක්ස් නිශාන්ත ප්‍රනාන්දු මහතා විමසා සිටින ලදී.

සම්පූර්ණයෙන්ම අප විසින් වියදම් කල මුදලම ලැබී ඇති බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

ගරු මන්ත්‍රීවරුන් විසින් මෙම කොම්පෝස්ට් අංගණයේ කටයුතු පිලිබඳව වැඩ අධිකාරි මහතාගෙන් තොරතුරු විමසා දැන ගන්නා ලදී.

තීරණ අංක 08

සෙන්දිරියාමුල්ල කොම්පෝස්ට් අංගණයේ අධියර 03හි ඉදි සඳහා රු.9,893,273.11ක ඇස්තමේන්තුව අනුමත කිරීම සුදුසු බවට ගරු සභාපතිතුමා යෝජනා කල අතර එම යෝජනාව ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා විසින් ස්ථිර කරන ලදී. ඒ අනුව ඒ සඳහා මහා සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදී.

- ගරු මන්ත්‍රීනී ආර්.නිරෝෂා ජීවන්ති ප්‍රනාන්දු මහත්මිය මෙම අවස්ථාවේදී සභා රැස්වීමට සහභාගී විය(පෙ.ව.11.50)

V. ගරු මන්ත්‍රී ඩබ්.ඇලෙක්ස් නිශාන්ත ප්‍රනාන්දු මහතාගේ කොට්ඨාසයේ කටයුත්තක් සම්බන්ධයෙන් කතා කිරීමට තිබෙන බවත්,වයික්කාල නුරාණි පොදු සුසාන භූමියේ දේහයන් භූම දානය කිරීමට නොහැකි තත්ත්වයක් තිබෙන බවත්,එම භූමියේ විශාල ප්‍රමාණයක් ගස් කීපයක් නිසා අවහිර වී ඇති බවත් ගරු මන්ත්‍රී ඩබ්.ජෝන් බැප්ටිස් ප්‍රනාන්දු මහතා ප්‍රකාශ කරන ලදී.රුස්ස මාර ගසක් හා තේක්ක ගස් 9 පමණ තිබෙන බවත්,ඒ සියල්ල සඳහා මිල ගණන් කැඳවා අලෙවි කර දේහයන් භූම දානය කිරීමට ඉඩ ලබාදෙන ලෙසට ඉල්ලා සිටින ලදී.

මෙය සභාවට පවරාගෙන තිබේදැයි ගරු සභාපතිතුමා විමසා සිටින ලදී.

මෙම යෝජනාව සම්බන්ධයෙන් තමන් ප්‍රාදේශීය ලේකම්තුමියට දන්වා වසරක් පමණ ගතවී ඇති බවත්,එය තවමත් සභාවට පවරාගෙන නොමැති බවත්,එම ඉඩම ඉඩම් සංස්ථාවට අයත් බවත් එය කර්මාන්ත පුරයක් ලෙස පවරාගත් බවත් ගරු මන්ත්‍රී ඩබ්.ඇලෙක්ස් නිශාන්ත ප්‍රනාන්දු මහතා ප්‍රකාශ කරන ලදී. එම කර්මාන්ත පුරයේ වෙන් කර ගත් එක් ඉඩම් කැබැල්ලක් මෙය බවත් මෙහි පැති තුනකින්

තාප්පය ගසා ඇති බවත්, මෙම ගස් කපා ඉවත් කරන තෙක් ඉදිරිපස තාප්පය ගැසීමට නොහැකි වී ඇති බවත් ප්‍රකාශ කරන ලදී. මෙය සභාවට පවරාගෙන මෙම කටයුතු සිදු කරමුයැයිද ප්‍රකාශ කරන ලදී.

ඒ සඳහා කාලයක් ගත වන බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

කැළෑ දෙපාර්තමේන්තුවට ලිපියක් දමා ඇති බවත් ගරු මන්ත්‍රී ඩබ්.ඇලෙක්ස් නිශාන්ත ප්‍රනාන්දු මහතා ප්‍රකාශ කරන ලදී.

එතැන ලක්ෂ 15 පමණ වටිනා තේක්ක ගස් තිබෙන බවත්,ඒවා අපගේ ඉදි කිරීමට් වලට ගැනීමට හැකි බවත් ගරු මන්ත්‍රී ඩබ්.ජෝන් බැප්ටිස් ප්‍රනාන්දු මහතා ප්‍රකාශ කරන ලදී.

මේ පිළිබඳව ගරු මන්ත්‍රීවරුන්ද තොරතුරු හා අදහස් ඉදිරිපත් කරන ලදී.

✪ ගරු සභාපතිතුමාගේ හා ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතාගේ යෝජනා ස්ථිරත්වයෙන් මහා සභා අවස්ථාව කාරක සභා අවස්ථාවක් බවට පත්කර ලේකම් මහතාට මේ පිළිබඳව සභාව දැනුවත් කිරීම සඳහා අවස්ථාව සලසා දෙන ලදී.

සුසාන භූමි පවරා ගන්නා ලෙස බොහෝ කලක සිට ඉල්ලා ඇති බවත්,නමුත් එම ක්‍රියාවලිය දීර්ඝ බවත් එම කඩදාසි ඉඩම් අමාතංශය දක්වා යායුතු බවත් එම ක්‍රියාවලිය කිරීමට බොහෝ කල් යන බවත් ලේකම් මහතා ප්‍රකාශ කරන ලදී.

නඩත්තු කරනුයේ සභාවෙන් වුවත් අයිතියට සභාවට ලබානොදෙන බව ගරු මන්ත්‍රී ඩබ්.ඇලෙක්ස් නිශාන්ත ප්‍රනාන්දු මහතා ප්‍රකාශ කරන ලදී.

මෙ අප සභාවට පමණක් තිබෙන ගැටළුවක් නොවන බවත්,කොතෙක් ඉල්ලා තිබුණද තවමත් එකක්වත පවරා දී නොමැති බවත් ලේකම් මහතා ප්‍රකාශ කරන ලදී.

පණතේ ඒවා නඩත්තු කරන ලෙසට පවසා ඇති බව ගරු මන්ත්‍රී ඩබ්.ඇලෙක්ස් නිශාන්ත ප්‍රනාන්දු මහතා ප්‍රකාශ කරන ලදී.

නමුත් නිත්‍යානුකූලව එය ලැබෙනුයේ ඒවා අපට පවරා දි ඉන් පසුව සුසාන භූමි ආඥා පනත යටතේ ගැසට් කල පසුව බව ලේකම් මහතා විසින් පැහැදිලි කර දෙන ලදී.ගස් ඉවත් කිරීම ප්‍රා දේශීය ලේකම්තුමියට හැකි බවත් ප්‍රකාශ කරන ලදී.

| තීරණ අංක 09 |
| --- |
| වයික්කාල නුරාණී සුසාන භූමියේ ඇති විශාල ගස් ඉක්මනින් ඉවත් කිරීම සුදුසු බවට ගරු මන්ත්‍රී ඩබ්.ජෝන් බැප්ටිස් ප්‍රනාන්දු මහතා විසින් ගෙන එන ලද යෝජනාව ගරු මන්ත්‍රී ඩබ්.ඇලෙක්ස් නිශාන්ත ප්‍රනාන්දු විසින් ස්ථිර කරන ලදී. ඒ අනුව ඒ සඳහා ගරු මහා සභාවේ ඒකමතිකව අනුමැතිය ලබා දෙන ලදී. |

b.<u>ගරු මන්ත්‍රී යෝජනා</u>

i. බටහිර දුම්මලදෙණිය ජනසවි මාවත වම්පස ඇතුලට ඇති ලිඳ සහිත බිම් කොටස දෙපස පදිංචිකරුවන් භූමිය අත්පත් කරගෙන ඇති බැවින් එම බිම් කොටස මැන සභාවට අයත් නිවැරදි භූමි ප්‍රමාණය වෙන්කර කම්බි ගසා තබන ලෙසට ගරු මන්ත්‍රී යූ.ජූඩ් එම්මානුවෙල් මහතා විසින් ඉදිරිපත් කරඇති යෝජනාව සලකා බැලීම

| |
|---|
| තීරණ අංක 10 |
| බටහිර දුම්මලදෙණිය ජනසවි මාවත වම්පස ඇතුලට ඇති ලිඳ සහිත බිම් කොටස දෙපස පදිංචිකරුවන් භූමිය අත්පත් කරගෙන ඇති බැවින් එම බිම් කොටස මැන සභාවට අයත් නිවැරදි භූමි ප්‍රමාණය වෙන්කර කම්බි ගසා තබන ලෙසට ගරු මන්ත්‍රී යූ.ජූඩ් එම්මානුවෙල් මහතා විසින් ඉදිරිපත් කරඇති යෝජනාව ගරු සභාපතිතුමා විසින් ස්ථිර කරන ලදී. ඒ අනුව ඒ සඳහා මහා සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදී. |

ii.2023 වර්ෂය සඳහා පහත සඳහන් ගරු මන්ත්‍රීවරුන් විසින් ඉදිරිපත් කර ඇති නව සංවර්ධන යෝජනා සඳහා අනුමැතිය ලබා දීමට අදාල යෝජනාව

තීරණ අංක 11

2023 වර්ෂය සඳහා පහත සඳහන් ගරු මන්ත්‍රීවරුන් විසින් ඉදිරිපත් කර ඇති නව සංවර්ධන යෝජනා සඳහා අනුමැතිය ලබා දීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් යෝජනා කල අතර එම යෝජනාව ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා විසින් ස්ථිර කරන ලදී. ඒ අනුව ඒ සඳහා මහා සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදී.

| **නම** | **යෝජිත සංවර්ධන ව්‍යාපෘතිය** |
|---|---|
| ගරු මන්ත්‍රී ඩබ්.ජෝන් බැප්ටිස් ප්‍රනාන්දු මහතා | • උ/කම්මල රංගම්මුල්ල ලංකා මාක් උළු කම්හල අසලින් ෂර්මිලා උත්සව භාණ්ඩ නිවස හිමිකරුගේ මාර්ගය තාර යොදා ප්‍රතිසංස්කරණය කිරිම<br>• ද/කම්මල ග්‍රාම නිළධාරී වසමේ ඩොල්ෆින් හෝටල් පරේ කෝප්සිටිය ඉදිරිපසින් වමට ඇති පළවෙනි අතුරු මාර්ගය දෙවැනි අදියර ප්‍රිමික්ස් යොදා ප්‍රතිසංස්කරණය<br>• අලුත් තොට ග්‍රාම නිලධාරී වසම කමත පාරේ ඉතිරි කොටස තාර යොදා ප්‍රතිසංස්කරණය<br>• අලුත්තොට ග්‍රාම නිලධාරී වසමේ ලූර්දු මාවතේ වමට ඇති දෙවැනි අතුරු මාර්ගය එක පුතාගේ නිවස දක්වා තාර යොදා ප්‍රතිසංස්කරණය කිරීම |
| ගරු මන්ත්‍රී ඩබ්.ඇලෙක්ස් නිශාන්ත ප්‍රනාන්දු මහතා | • බෝලාන එකමුතු මාවත තාර දැමීම<br>• ද/වයික්කාල සේවියර් දේවස්ථානය අසල පාර තාර දැමීම<br>• වයික්කාල සහනගම ක්‍රීඩාංගණයේ වටදැල් ගසා ගොඩකර පිළිසකර කිරීම<br>• වයික්කාල නානතොටුපල පාර අනාථ අගල හරහා බෝක්කුව ඉදි කිරීම |

| | |
|---|---|
| | • වයික්කාල ජේසුනසරේනු මාවත බෝක්කුව පිළිසකර කිරීම |
| ගරු මන්ත්‍රී ඒ.රෙක්ෂි ප්‍රභාත් ප්‍රනාන්දු මහතා | ගාලවත්ත ප්‍රධාන මාර්ගය අළුත්වැඩියාව |

## 05. කාරක සභා වාර්තා සලකා බැලීම.

i. 2022-12-08, 2022-12-13, 2022-12-27 හා 2022-12-30 වන දින වල පැවති මුදල් හා ප්‍රතිපත්ති කාරක සභා වාර්තා සලකා බැලීම

2022-12-13 වන දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කාරක සභාවේදී ලිහිරියාගම සතිපොල සම්බන්ධයෙන් සාකච්ඡා කර ඇති බවත්,එ් අනුව 10%කින් මිල ගණන් වැඩි කර නැවත ටෙන්ඩර් කැඳවීමේදී සම්ප්‍රදායානුකූලව දැනුම් දීමක් කල යුතු බවත්,එම දැනුම් දුන් ලිපිය ලිපි ගොණුවේ පමණක් ඇතුළත් කර තිබෙන බව ගරු මන්ත්‍රී සී.පී.සරත් වික්‍රමරත්න මහතා ප්‍රකාශ කරන ලදී. තමන් පොළ නිරීක්ෂණයට ගිය බවත්,නමුත් එම පොළ භාරකරු විසින් එවැනි දැන්වීමක් නොදුන් බව පැවසූ බවත්,උප කාර්යාලයටද ගිය නමුත් පැරණි සියල්ලම පුවරුවේ තිබුණත් මෙය නොතිබුණ බව ප්‍රකාශ කරන ලදී.එලෙස කටයුතු සිදු නොකරන ලෙසත්,ඒකපාක්ෂික වී ඇති බවත් තවදුරටත් ප්‍රකාශ කරන ලදී.

එය නීත්‍යානුකූලව සිදු කරන ලෙසට කමිටුවේදී පැවසූ බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.නිලධාරීන් ලෙස ඔවුන් නිවැරදිව එම කටයුත්ත සිදු කල බවද ප්‍රකාශ කරන ලදී.

නමුත් එය සිදු වී නොමැති බව ගරු මන්ත්‍රී සී.පී.සරත් වික්‍රමරත්න මහතා ප්‍රකාශ කරන ලදී.

ඒ පිළිබඳව තමන් සොයා බලන බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

එලෙස කටයුතු නොකරන ලෙසත්,කරන දේ නිවැරදිව සිදු කරන ලෙසත්,ටෙන්ඩර් ක්‍රමවේදය අනුව කටයුතු කරන ලෙසත් ගරු මන්ත්‍රී සී.පී.සරත් වික්‍රමරත්න මහතා ප්‍රකාශ කරන ලදී.

මෙය නිරීක්ෂණයට උප කාර්යාලයට ගිය බවත්,එහිදී එක් නිලධාරීනියක් විසින් දූරකථනය පැය ගණනාවක් ඔබමින් කාලය ගත කල බවත්,ගරු මන්ත්‍රීවරුන්ව ගණන් නොගත් බවත් ගරු මන්ත්‍රී ඩබ්.ඒ.ගෝඨාභය වික්‍රමසිංහ මහතා ප්‍රකාශ කරන ලදී. ඒ පිළිබඳව සොයා බලන ලෙසත් ප්‍රකාශ කරන ලදී.

නිලධාරීන් මහජන සේවයට සිටින බවත්,ජනතාව ඔවුන්ට පඩිය ගෙවන බවත්,කවුරුන් හෝ පැමිණ සිටියදී එම පැමිණ තිබෙන කාරණාව ඇසිය යුතු බවත් ඒ කිසිවක් නොකර දූරකථනය ඔබමින් කාලය ගත කල බවත් ගරු මන්ත්‍රී සී.පී.සරත් වික්‍රමරත්න මහතා ප්‍රකාශ කරන ලදී.

තීරණ අංක 12

2022-12-08 , 2022-12-13 , 2022-12-27 හා 2022-12-30 වන දින වල පැවති මුදල් හා ප්‍රතිපත්ති කාරක සභා වාර්තා සත්‍ය වාර්තා බව ගරු මන්ත්‍රීනී ජේ.කේ.දීපා මේරි අයිරංගනී පෙරේරා මහත්මියගේ හා ගරු මන්ත්‍රීනී අයි.එච්.නයෝමි රම්‍යලතා මහත්මියගේ යෝජනා ස්ථිරත්වයෙන් සභා සම්මත විය. ඒ අනුව එම වාර්තාවේ සඳහන් තීරණ ක්‍රියාත්මක කිරීම සඳහා මහා සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදී.

ii. 2022-12-02 වන දින පැවති මාර්ග,ඉඩම්,ගොඩනැඟිලි හා කාර්මික සේවා කාරක සභා වාර්තාව සලකා බැලීම

තීරණ අංක 13

| |
|---|
| 2022-12-02 වන දින පැවති මාර්ග,ඉඩම්,ගොඩනැඟිලි හා කාර්මික සේවා කාරක සභා වාර්තාව සත්‍ය වාර්තාවක් බව ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතාගේ හා ගරු උප සභාපති ආර්.ඒ.නිලංක සඳකැල් මහතාගේ යෝජනා ස්ථීරත්වයෙන් සභා සම්මත විය. ඒ අනුව එම වාර්තාවේ සඳහන් තීරණ ක්‍රියාත්මක කිරීම සඳහා මහා සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදී. |

iii. 2022-12-01 වන දින පැවති පොදු පහසුකම් හා ආපදා කළමනාකරණ කාරක සභා වාර්තාව සලකා බැලීම

| |
|---|
| තීරණ අංක 14<br><br>2022-12-01 වන දින පැවති පොදු පහසුකම් හා ආපදා කළමනාකරණ කාරක සභා වාර්තාව සත්‍ය වාර්තාවක් බව ගරු මන්ත්‍රී ආර්.පී.අකිල ශිරංග රාජපක්ෂ මහතාගේ හා ගරු මන්ත්‍රී ඩබ්.ඒ.රෙන්ෆ්‍රිඩ් ෂවීන් ප්‍රනාන්දු මහතාගේ යෝජනා ස්ථීරත්වයෙන් සභා සම්මත විය. ඒ අනුව එම වාර්තාවේ සඳහන් තීරණ ක්‍රියාත්මක කිරීම සඳහා මහා සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදී. |

මෙම කමිටුව සම්බන්ධයෙන් සාකච්ඡා කල යුතු බවත්,බල්බ ගැටළුව තවමත් තිබෙන බවත්, මාසයකට එක් වරක් පමණක් අළුත්වැඩියාවට පැමිණෙන බවත්,එවිට නැවතත් බල්බ මාරු කිරීමට මාසයක් ගත වන බවත් එබැවින් තවත් වාහනයක් දමා හෝ නැවත අක්‍රීය වන බල්බ සකස් කර දෙන දෙන ලෙසට ගරු මන්ත්‍රී ඩී.එල්.අමල් සුරංග මහතා විසින් ඉල්ලා සිටින ලදී.

එය පැවසූවට සිදු නොවූ බව ගරු මන්ත්‍රී එම්.එම්.ජිනේන්ද්‍ර විශ්වනාත් මංචනායක මහතා ප්‍රකාශ කරන ලදී.

අද වන විට LED බල්බය සෑම කණුවකටම වාගේ දමා ඇති බවත් අද වන විට ලොකු පැමිණිලි ගොඩක් නොමැති බවත්,වියදම් සමඟ ගැලපීමට උත්සාහ කල බවත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.සෑම දාම දවසට රු.300.00ක රු.400.00ක මුදලක් බැංකු කටයුතු සඳහා දන්කොටුව උප කාර්යාලයට වයදම් කල බවත්,තමන් ජනවාරි 01 වන දා සිට සභාවේ ත්‍රීවිල් රථය දන්කොටුවට ලබා දුන් බවත් ප්‍රකාශ කරන ලදී.වරිපනම් එ්කක නිවැරදිව හඳුනාගත් නිසා අද වන විට දියුණුවට පත් වීඇති බවත්,අද වන විට මුළු බල ප්‍රදේශයේම ලක්ෂ 43 පමණ එකතු වීමට තිබෙන බවත් එබැවින් තවත් සේවාව පුළුල් කර ගැනීමට තමන් අදහස් කල බවත් ප්‍රකාශ කරන ලදී.ඊයේ දිනයේදී කහටවිල කොට්ඨාසයේ බල්බ 30-35 පමණ වැය වී තිබූ බවත්, තමන් අද උදෑසන එක් කණ්ඩායමක් සවස 2න් පසුව රාජකාරියට ගෙන්වීමට තීරණය කල බවත්,එක් කණ්ඩායමක් උදෑසන වරුවේද තවත් කණ්ඩායමක් සවස 2න් පසුවත් ගෙන්වීමට තමන් ලේකම් මහතා සමඟ සාකච්ඡා කල බවත් ප්‍රකාශ කරන ලදී.මෙය සතියක් දෙකක් පමණ සිදු කර බලමුයැයිද,රෑ 9 වන තෙක් දෙවන කණ්ඩායමට වැඩ කටයුතු කිරීමට හැකි බවත් තවදුරටත් ප්‍රකාශ කරන ලදී.එම දෙවන කණ්ඩායම මඟින් අවමංගල්‍යය සඳහා ෆ්ලෑෂර් ගැසීමට යොමු කල හැකි බවත් තවදුරටත් ප්‍රකාශ කරන ලදී.

ෆ්ලෑෂරයක් ගැසූ පසුව දින දෙකකින් පමණ එය ගලවා දමන ලෙසත්,සති ගණනක් එය කණුවේ පත්තු වෙන බවත් ගරු මන්ත්‍රී එම්.එම්.ජිනේන්ද්‍ර විශ්වනාත් මංචනායක මහතා ප්‍රකාශ කරන ලදී.

විවිධ ප්‍රශ්න ගැටළු තිබෙන බවත්,නමුත් මේ සඳහා ගරු මන්ත්‍රීවරුන්ගේ සහයෝගයද ලබා දෙන ලෙසත්,එක් වාහනය සඳහා කණ්ඩායම් දෙකක් යොදවමුයැයිද ගරු සභාපතිතුමා යෝජනා කරන ලදී.

උදෑසන 8.30ට යන ලෙසට කෙතරම් පැවසුවත් ඔවුන් නොයන බවත්,දින කීපයක් තමන්මෙතැන රැඳී සිට ඔවුන්ව පිටත් කල බවත් ගරු මන්ත්‍රී යූ.ජුඩ් එම්මානුවෙල් මහතා ප්‍රකාශ කරන ලදී.

ලේකම් මහතා සමඟ මේ පිළිබඳව කතා කරගන්නා ලෙස ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

එසේ නම් අදාල සේවකයින්ද එම සාකච්ඡාවල යොමු කර ගත යුතු බවත්, එලෙස උදේ යාමට බාදාවක් තිබේනම් එම බාධාව හඳුනා ගත යුතු බවත්,උදෑසන 8ට පෙර පැමිණෙන බවත්,ඉන්පසුව 8.30 – 9.00 පමණ වන තෙක් උදෑසන ආහාරය ගන්නා බවත් ගරු මන්ත්‍රී යූ.ජූඩ් එම්මානුවෙල් මහතා ප්‍රකාශ කරන ලදී.

බල්බ ගැනීමට දන්කොටුවට යන බවත්,එබැවින් ප්‍රමාද වන බවට තමන්ට පවසන බව ගරු මන්ත්‍රිනී ආර්.නිරෝෂා ජීවන්ති ප්‍රනාන්දු මහත්මිය ප්‍රකාශ කරන ලදී.

එය සැම දාම සිදු නොවන බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී. දෙසැම්බර් මස බල්බ ගැනීමට මුදල් නොතිබුණ බවත්, LED බල්බ ගලවාගෙන ඒමේදී ඒවා තෝරාගෙන ගෙන ගොස් කලමනාකරණය කර ගෙන මෙම කටයුතු සිදු කල බවත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

වැඩ කරන පිරිසට 5න් පසුව OT නොමැති බව පවසන බව ගරු මන්ත්‍රී ඩබ්.ඇලෙක්ස් නිශාන්ත ප්‍රනාන්දු මහතා ප්‍රකාශ කරන ලදී.

- ගරු සභාපතිතුමාගේ හා ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතාගේ යෝජනා ස්ථිරත්වයෙන් මහා සභා අවස්ථාව කාරක සභා අවස්ථාවක් බවට පත්කර ලේකම් මහතාට මේ පිළිබඳව සභාව දැනුවත් කිරීම සඳහා අවස්ථාව සලසා දෙන ලදී.

මෙහි කණ්ඩායම් දෙකක් දැමීමට යන බවත්,එක් වාහනයක් පමණක් තිබෙන බවත් එබැවින් ඔවුන්ගේ රාජකාරී වේලාවන් සැදුව පසුව ඔවුන්ට OT ලබා දීමට අවශ්‍ය නොවන බව ලේකම් මහතා විසින් පවසා සිටින ලදී.

වසරකට ආසන්න කාලයක සිට බීගන් බල්බ අළුත්වැඩියා නොකල බවත්,ඒවා සභාවට පැමිණ තිබේදැයිද ගරු මන්ත්‍රී ඩී.එල්.අමල් සුරංග මහතා විමසා සිටින ලදී. බීගන් බල්බ අවශ්‍ය බවත් ප්‍රකාශ කරන ලදී.

දන්කොටුව පොළ භූමියේ කාණු පද්ධතිය සුද්ද පවිත්‍ර කර දෙන ලෙසත්,පොළ භූමියේ තාර ගැලවී ගොස් ඇති බවත් එයද පිළිසකර කර දෙන ලෙසත්,එමෙන්ම කරවළ වීදියේ යකඩ බම්බු අබලන් වීගෙන යන බවත් ඒවා දිරා ඇති බවත් ඒවාට කොන්ක්‍රීට් දමා දෙන ලෙසත් ගරු මන්ත්‍රී ඩී.එල්.අමල් සුරංග මහතා ඉල්ලා සිටින ලදී.

දන්කොටුවේ ගැටළුවට හෙට දින කමිටුව රැස් වන බවත් එවිට මේ පිළිබඳවද සොයා බලා නිරීක්ෂණය කරගෙන පැමිණෙන ලෙසට කමිටු සභාපතිතුමාට ගරු සභපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

සාන්තානාපුර සතිපොළේ හරක් බඳින බවත්,පසුගිය සතියේ මස් කඩයේ හරක් බැඳ තිබූ බවත්,එවිට අපිරිසිදු වන බවත්,වටේට කම්බි ගසා පොළ භූමිය ආවරණය කර දෙන ලෙසට ගරු මන්ත්‍රිනී ජේ.කේ.දීපා මේරි අයිරංගනී පෙරේරා මහත්මිය ප්‍රකාශ කරන ලදී.අල්ලපු වැටේ මස් කඩ අයිතිකරුවන් සිටින බවත්,ඔවුන් අනවසරයෙන් පොළ භූමියට ගේට්ටු දමාගෙන සිටින බවත් ඒ පිළිබඳවද සොයා බලන ලෙසත් ඉල්ලා සිටින ලදී.

ඒ පිළිබඳව සොයා බලන බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

සභාව මඟින් බදු අයකරගන්නා බවත්, මුදල් ලැබෙන බවත් ගරු පෙස්ටස් පෙරේරා මැතිතුමා සිටියදී සෑදූ පොළ ඇරෙන්න දන්කොටුවට පොළක් නොතිබුණ බවත්, එතුමා විශාල මුදලක් ගෙනැවිත් ලස්සන පොළක් සාදා දුන් බවත් ගරු මන්ත්‍රී එල්. සුසන්ත ශ්‍රීනාත් ප්‍රනාන්දු මහතා ප්‍රකාශ කරන ලදී. ගරු මන්ත්‍රී ඩී.එල්.අමල් සුරංග මහතා ඉහත කාරණා පිළිබඳව මීන් පෙරදීද කතා කල බවත්,ගරු සභාපතිතුමාලාගේ පාලන කාලයේදී එය ආරක්ෂා කර ගත යුතු බවත්,එම පැවසූ කාරණා වලට විශාල මුදලක් වැය නොවන බවත් තවදුරටත් ප්‍රකාශ කරන ලදී.

පොල උසින් වැඩි බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

නිලධාරීන් අනුමත කල ආකාරයට එයසෑදුව බව ගරු මන්ත්‍රී එල්. සුසන්ත ශ්‍රීනාත් ප්‍රනාන්දු මහතා ප්‍රකාශ කරන ලදී.

දන්කොටුව පොල ඉතාමත් වටිනා සම්පතක් බවත්, නිලදාරීන්ද මෙහි සිටින බැවින් හෙටම ගොස් ඒ සම්බන්ධයෙන් වාර්තාවක් සකස් කර ඉදිරිපත් කරන ලෙසට ගරු මන්ත්‍රී කේ.නාමල් අනුරුද්ධ සිරිවර්ධන ප්‍රනාන්දු මහතා ප්‍රකාශ කරන ලදී.

සඳුදා දිනයේදී පැමිණ පොලේ වෙළෙන්දන්ගෙන් මෙම ප්‍රශ්න සියල්ලම විමසා දැන ගන්නා ලෙස ගරු මන්ත්‍රී ඩී.එල්.අමල් සුරංග මහතා ප්‍රකාශ කරන ලදී.

දන්කොටුව පොලේ කරවල විකුණන ස්ථානයේ වහල තහඩු ගැලවී ඇති බවත්, තමන් ඒ සම්බන්ධයෙන් කතා කල බවත් ගරු මන්ත්‍රී කේ.නාමල් අනුරුද්ධ සිරිවර්ධන ප්‍රනාන්දු මහතා ප්‍රකාශ කරන ලදී.

වතුර ටැංකි 10ක් ගෙනා බවත්,ඒවා කිරිමැටියානේ ගබඩා කර ඇති බවත්, එම ටැංකි රු.50,000කට පමණ මිලදී ගත් බවත් මේ වන විට ටැංකියක මිල රු.ලක්ෂ 4ක් 5ක් පමණ වන බවත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.ඒවා ස්ථාපිත කර ගැනීමට රු.ලක්ෂ 25ක් අයවැයෙන් වෙන් කර ඇති බවත් ඉතාමත් ඉක්මනින් ඒවා ස්ථාපිත කරන ලෙසට ලේකම් මහතාට සහ වැඩ අධිකාරී මහතාට දැනුම් දෙන ලදී.ඒ සඳහා අදාල මන්ත්‍රීවරුන් සම්බන්ධ වී කටයුතු කරන ලෙසත් ගරු සභාපතිතුමා දැනුම් දෙන ලදී.

ජලය පිරවිය යුතු බැවින් ඉතාමත් උසකින් එය ස්ාපිත කල නොහැකි බවත්,එබැවින් සියල්ලම බලා එම වතුර ටැංකිය තැබිය හැකි ශක්තිමත් පාදමක් සාදා දෙන ලෙසත්,එය කර්මාන්ත කමිටුවට යොමු කර ඉන් පසුව ඉදිරි කටයුතු සිදු කල හැකි බවත් ගරු මන්ත්‍රී එම්.එම්.ජිනේන්ද්‍ර විශ්වනාත් මංචනායක මහතා ප්‍රකාශ කරන ලදී.

මෙම වාර්තාව සමඟ දන්කොටුව පොළ සම්බන්ධ වාර්තාවද ඊළඟ කර්මාන්ත කමිටුවට දමන ලෙස ගරු මන්ත්‍රී කේ.නාමල් අනුරුද්ධ සිරිවර්ධන ප්‍රනාන්දු මහතා ප්‍රකාශ කරන ලදී.

මෙහිදී යකඩ රාමුවක් මත නොව කොන්ක්‍රීට් එකක් උඩ මෙය සාදා ගන්නා ලෙසත්,නැතිනම් යකඩ දිරාපත් වන බවත් ගරු මන්ත්‍රී ඩබ්.ජෝන් බැප්ටිස් ප්‍රනාන්දු මහතා ප්‍රකාශ කරන ලදී.

මේ පිළිබඳව වැඩ අධිකාරී මහතා සමඟ සාකච්ඡා කර ඉක්මනින් සිදු කරන ලෙසත්,මේ පිළිබඳව ගරු මන්ත්‍රී යූ.ජූඩ් එම්මානුවෙල් මහතාට අධීක්ෂණය කරන ලෙසත් ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

ටැංකියේ ආරාක්ෂාව සම්බන්ධයෙන් කතා කල යුතු බවත්,යම් පුද්ගලයෙකු බීමත්ව යාමේදී කඩුවකින් හෝ පිහියකින් එම ටැංකියට හානි කල හැකි බවත්,එමෙන්ම යම් ආරවුලක් ඇති වී යමක් මිශ්‍ර කල හැකි බවත් ගරු මන්ත්‍රී කේ.නාමල් අනුරුද්ධ සිරිවර්ධන ප්‍රනාන්දු මහතා ප්‍රකාශ කරන ලදී.ටැංකියේ ආරක්ෂාව හා එමඟින් ලබා ගන්නා ජලයේ ආරක්ෂාව එමෙන්ම ඒ සම්බන්ධයෙන් අප සභාවට තිබෙන වගකීම,නඩත්තුව යන කරුණු කාරණා සලකා බැලිය යුතු බවත් ප්‍රකාශ කරන ලදී.

ප්‍රදේශයේ මන්ත්‍රීවරයෙකු සිටුනුයේ ඒ පිළිබඳව සොයා බැලීමට බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

මේ සඳහා සුදු යකඩ පියනක් දමා ඉබි යතුරු දැමීමට සකස් කර ගත හැකි බව ගරු මන්ත්‍රී එම්.එම්.ජිනේන්ද්‍ර විශ්වනාත් මංචනායක මහතා ප්‍රකාශ කරන ලදී.

එලෙස කටයුතු නොකරන පිරිසක් මේ වන විට එහි සිටින බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

එක් එක් කොටසේ ප්‍රජා ශාලාවේ එය ස්ථාපිත කිරීමට සූදානම් වී සිටින බවත්,එවිට සමිති වල සිටින සභාපතිතුමන්ලාට එය භාර දිය හැකි බව ගරු මන්ත්‍රිනී ජේ.කේ.දීපා මේරි අයිරංගනී පෙරේරා මහත්මිය ප්‍රකාශ කරන ලදී.

එය කලමනාකරණය කර ගැනීමට හැකි බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

iv. 2022-12-06 වන දින පැවති සංවර්ධන උපදේශක කාරක සභා වාර්තාව සලකා බැලීම

| |
|---|
| තීරණ අංක 15<br>2022-12-06 වන දින පැවති සංවර්ධන උපදේශක කාරක සභා වාර්තාව සත්‍ය වාර්තාවක් බව ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතාගේ හා ගරු මන්ත්‍රිනී ජී.ලීනා ප්‍රියංගිකා මහත්මියගේ යෝජනා ස්ථිරත්වයෙන් සභා සම්මත විය. ඒ අනුව එම වාර්තාවේ සඳහන් තීරණ ක්‍රියාත්මක කිරීම සඳහා මහා සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදී. |

v. 2022-12-29 වන දින පැවති පරිසර සහ මහජන සෞඛ්‍ය පහසුකම් සංවර්ධන කාරක සභා වාර්තාව සලකා බැලීම

| |
|---|
| තීරණ අංක 16<br><br>2022-12-29 වන දින පැවති පරිසර සහ මහජන සෞඛ්‍ය පහසුකම් සංවර්ධන කාරක සභා වාර්තාව සත්‍ය වාර්තාවක් බව ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතාගේ හා ගරු මන්ත්‍රිනී ජී.ලීනා ප්‍රියංගිකා මහත්මියගේ යෝජනා ස්ථිරත්වයෙන් සභා සම්මත විය. ඒ අනුව එම වාර්තාවේ සඳහන් තීරණ ක්‍රියාත්මක කිරීම සඳහා මහා සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදී. |

## 06.ලැබීම් හා වියදම් පිළිබඳ මාසික ප්‍රකාශ එකතු කල ආදායම් පිළිබඳ ප්‍රගති වාර්තා සහ සභාවට ඉදිරිපත් කිරීමට නියමිත වෙනත් ලේඛන ඉදිරිපත් කිරීම හා සළකා බැලීම.

**i. මාසික ඒකාබද්ධ ලැබීම් සාරාංශය -2022 නොවැම්බර්**

**ii. මාසික ඒකාබද්ධ ගෙවීම් සාරාංශය -2022 නොවැම්බර්**

ගරු මන්ත්‍රී සී.පී.සරත් වික්‍රමරත්න මහතා ගරු සභාපතිතුමාගෙන් අවසර ගැනීමෙන් පසුව නොවැම්බර් මස ලැබීම් සාරාංශයේදී ප්‍රාග්ධන ආදායම් කිසිවක් ලැබී නොමැති බව ප්‍රකාශ කරන ලදී.

චෙක්පත පසුගිය දින වල ලියවී තිබූ බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

සැප්තැම්බර් මස ප්‍රාග්ධන ආදායම් රු.354,549.26 ලැබී ඇති බවත්,එවිට රු.එක්කෝටි ගණනක් තිබෙන බවත්,මේ වන විට ප්‍රාග්ධන ආදායම් කොපමණ ලැබීමට තිබේදැයිද ගරු මන්ත්‍රී සී.පී.සරත් වික්‍රමරත්න මහතා විමසා සිටින ලදී.

මෙම අහන ගැටළුවේදී අවසන් ශේෂය සම්බන්ධයෙන් කතා කිරීමේදී මෙහි ලක්ෂ 99ක වැය ශේෂයක් අය ශේෂයට වඩා පෙන්නුම් කරන බවත්,දෙසැම්බර් මස ශේෂය ද ගෙන කතා කල යුතු බවත් ගරු මන්ත්‍රී ඒ.එස්.එම් කිත්සිරි අභයවික්‍රම මහතා ප්‍රකාශ කරන ලදී.

සැම දාම කතා කිරීමේදී ප්‍රාග්ධන ආදායම් ලැබුණ බව පවසන බවත්,නමුත් නොවැම්බර් මාසයේදී කිසිදු මුදලක් ලැබී නොමැති බවත් සැප්තැම්බර් මාසයේදී තුන් ලක්ෂ ගණනක් ලැබි ඇති බවත් ගරු මන්ත්‍රී සී.පී.සරත් වික්‍රමරත්න මහතා ප්‍රකාශ කරන ලදී.

දෙසැම්බර් මාසයේදී චෙක්පත් ලැබුණ බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

නමුත් මාර්ග වලට අදාල චෙක්පත් ලැබුණ බවත්,ඒ සම්බන්ධයෙන් විමසා සිටින ලදී.

දෙසැම්බර් මස මුල සිටම ඒවා ලැබුණ බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

| |
|---|
| තීරණ අංක 17<br><br>2022 නොවැම්බර් මස මාසික ඒකාබද්ධ ලැබීම් සාරාංශය සහ මාසික ඒකාබද්ධ ගෙවීම් සාරාංශය සත්‍ය වාර්තා බව ගරු මන්ත්‍රී ඒ.එස්.එම් කිත්සිරි අභයවික්‍රම මහතා යෝජනා කල අතර ගරු මන්ත්‍රී සී.පී.සරත් වික්‍රමරත්න මහතා විසින් ස්ථිර කරන ලදී. ඒ අනුව ඒ සඳහා ගරු මහා සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදී. |

iii. 2022 දෙසැම්බර් මස ඉන්ධන හා අළුත්වැඩියා වෙනුවෙන් වියදම් වූ වාර්තාව සලකා බලන ලදී.

iv. 2022 වර්ෂයේ දෙසැම්බර් මස වීථි පහන් නඩත්තු කිරීම පිළිබඳ ප්‍රගති වාර්තාව සලකා බලන ලදී.

## 07. වෙනත් කරුණු ඉදිරිපත් කිරීම.

(i). වෙන්නප්පුව ප්‍රාදේශීය සභාව සඳහා සූර්ය පැනල පද්ධතිය සවි කිරීමට අදාලව රුපියල් මිලියන විසි පහක ඉල්ලුම් කර ඇති ණය මුදල සංශෝධනය කිරීම

| |
|---|
| තීරණ අංක 18<br><br>වෙන්නප්පුව ප්‍රාදේශීය සභාව සඳහා සූර්ය පැනල පද්ධතිය සවි කිරීමට අදාලව රු මිලියන විසි පහක ඉල්ලුම් කර ඇති ණය මුදල තවමත් ලැබී නොමැති බැවින් එම ණය මුදල නැවත සංශෝධනය කර මෙම ව්‍යාපෘතියේ සම්පූර්ණ මුදලම එනම් රු මිලියන තිස් හයක මුදල එමඟින් ලබා ගැනීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් ගෙන එන ලද යෝජනාව ගරු මන්ත්‍රී සී.පී.සරත් වික්‍රමරත්න මහතා විසින් ස්ථිර කරන ලදී. ඒ අනුව ඒ සඳහා මහා සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදී. |

(ii).වෙන්නප්පුව සංවර්ධන සමුපකාර සමිතිය මඟින් ඉල්ලීමක් කර ඇති බවත් ඔවුන්ට සිටීමට ස්ථානයක් නොමැති බැවින් කිරිමැටියාන කෝප් සිටිය අසල ප්‍රජා ශාලාවට ගැනීමට ඉඩම මේ සඳහා ලබා දෙමුයැයි ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

මොවුන්ට මෙම ස්ථානය ලබා දීම සාධාරණ බව ගරු මන්ත්‍රී යූ.ජුඩ් එම්මානුවෙල් මහතා ප්‍රකාශ කරන ලදී. 1973 පිහිටවූ ආයතන වලින් මෙම ආයතනය පමණක් ඉතිරි වී ඇති බවත්,ප්‍රාදේශීය ලේකම් කාර්යාල භූමියේ තිබූ ආයතනය මීට වසර ගණනාවකට පෙර ඉවත් කල බවත් තවදුරටත් ප්‍රකාශ කරන ලදී.

ගරු මන්ත්‍රීවරුන් මේ පිලිබඳව අදහස් ඉදිරිපත් කරන ලදී.

බදු පදනම මත මොවුන් ලුණුවිල ඉඩම ඉල්ලූ බවත්,ඉන්පසුව ප්‍රධාන මාර්ගය අසලින් අවශ්‍ය බව පැවසූ බවත්,නැතිනම් තවමත් එම ලුණුවිල ඉඩම බදු පදනම මත ලබා දීමට හැකි බවත් ගරු මන්ත්‍රී එම්.එම්.ජිනේන්ද්‍ර විශ්වනාත් මංචනායක මහතා ප්‍රකාශ කරන ලදී.

ප්‍රජා ශාලාවක් ඉදි කිරීමටද ඉල්ලීමක් කර ඇති බව ගරු මන්ත්‍රී කේ.එල්.චමින්ද කුමාර කරුණානායක මහතා ප්‍රකාශ කරන ලදී.

මෙම දෙකම සඳහා එම ස්ථානයෙන් ඉඩම් කොටස් දෙකක් ලබාදෙමුයැයි ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

ඔවුන්ට එය ඉදි කිරීමට පැවසීමේදී මුළු භූමියේම එය ඉදි කලහොත් ගැටළුවක් මතු වන බවත්,එබැවින් වැඩ අධිකාරී මහතාගේ අධීක්ෂණය යටතේ එම කටයුතු සිදු කරමුයැයිද ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා ප්‍රකාශ කරන ලදි.

තීරණ අංක 19
වෙන්නප්පුව සංවර්ධන සමූපකාර සමිතිය සඳහා කිරිමැටියාන කෝප් සිටිය අසල භූමිය බදු ලබා දීම සුදුසු බවත්,එමෙන්ම එම ස්ථානය ප්‍රජා ශාලාවක්ද ඉදි කිරීමට ඉල්ලා ඇති බැවින් එම ගොඩනැඟිලි දෙකම සඳහා සුදුසු පරිදි ඉදි කිරීම් සිදු කිරීම සුදුසු බවත් මේ සියල්ලම වැඩ අධිකාරී මහතාගේ අධීක්ෂණය යටතේ සිදු විය යුතු බවටත් මහා සභාව ඒකමතිකව තීරණය කරන ලදී.

(iii). ගරු මන්ත්‍රී ඩබ්.ඒ.ගෝඨාභය වික්‍රමසිංහ මහතා විසින් ලුණුවිල කිංස්ලි පෙරේරා මාවතට බෝඩ් එක නොගසන්නේ මන්දැයිද විමසා සිටින ලදී.

මුදල් කමිටුව මඟින් බෝඩ් සඳහා මුදල් වැය නොකිරීමට තීරණය කර ඇති බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී. කිසිවෙකුගේ විරෝධතාවයක් නොමැති නම් එය සිදු කිරීමට තමන් අවසර ලබාදෙන බවත්,නමුත් බෝඩ් සඳහා සභාවෙන් මුදල් වැය නොකරන බවත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

තීරණ අංක 20

ලුණුවිල මංසන්ධියේ සිට දකුණු දිශාවට ඇති මාර්ගයේ පුස්තකාලයට පෙර වම්පස අතුරු මාර්ගය "කිංස්ලි පෙරේරා" මාවත ලෙස නම් කිරීම සුදුසු බවට ගරු මන්ත්‍රී ඩබ්.ඒ.ගෝඨාභය වික්‍රමසිංහ මහතා විසින් ඉදිරිපත් කල යෝජනාව සඳහා මහා සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදී.

(iv).මැද දුම්මලදෙණිය ජයකොඩි මහතාගේ නිවස පාර ඉතිරි කොටස තාර දමා සකස් කිරීම සුදුසු බව ගරු සභාපතිතුමා විසින් යෝජනා කරන ලදී.

තීරණ අංක 21

මැද දුම්මලදෙණිය ජයකොඩි මහතාගේ නිවස පාර ඉතිරි කොටස තාර දමා සකස් කිරීමට අදාල යෝජනාව ගරු සභාපතිතුමා විසින් යෝජනා කල අතර එම යෝජනාව ගරු මන්ත්‍රී යූ.ජුඩ් එම්මානුවෙල් මහතා විසින් ස්ථිර කරන ලදී.ඒ අනුව ඒ සඳහා ගරු මහා සභාවේ ඒකමතිකව අනුමැතිය ලබා දෙන ලදී.

(v). ගරු මන්ත්‍රිනී අයි.එච්.නයෝමි රම්‍යලතා මහත්මිය ගරු සභාපතිතුමා ඇතුළු සියළුම දෙනාගෙන් අවසර ගැනීමෙන් පසුව ඉදිරියේදී එළඹීමට නියමිත පෙබරවාරි 04 වන දින නිදහස් උත්සවයට සමගාමීව අන්තර් කොට්ඨාස මට්ටමින් කථික තරඟාවලියක් දරුවන් සඳහා සභාවක් ලෙස සූදානම් කර දීම සුදුසු බවට යෝජනා කරන ලදී.මීට වසර ගණනාවකට පෙර විවිධ සේවා සමූපාකාර හරහා පාසල් හා දහම් පාසල් මට්ටමින් නිදහස් උත්සව තරඟාවලි පවත්වාගෙන පැමිණි බවත්,නමුත් රටේ පැවතුන හේතු කාරණාත් සමඟ දරුවන්ගෙන් මේවා ඈත් වූ බවත් ප්‍රකාශ කරන ලදී.මේවා දරුවන්ට සමීප කල යුතු බවත්,දරුවන් අපේ රටේ සිටි ජාතික වීරවරයන්,නිදහස යනු කුමක්ද එමෙන්ම කවුරුන් මෙම නිදහස රටටට ගෙනත් දුන්නේද යන්න දැන ගත යුතු බවත්, ඒවා දරුවන් තුලින් ඈතට ගමන් කර ඇති බවත් වෙන්නප්පුව ප්‍රාදේශීය සභාවක් ලෙස මේ වන විට විශාල වැඩ කොටසක් සිදු කරන බවත් දරුවන් යනු රටේ අනාගතය බවත් ප්‍රකාශ කරන ලදී.ප්‍රාදේශීය සභාවක් ලෙස හැකියාවක් තිබේනම් මෙය සිදු කරන ලෙසත් ඉල්ලා සිටින ලදී.

එම දරුවන්ට ප්‍රාදේශීය සභාව තුළින් ඉටු වන මෙහෙවර පිළිබඳව කථික තරඟයක් පැවැත්වීමට හැකි නම් හොඳ බවත්,එවිට දරුවන් මේ පිළිබඳව සොයා බැලීමක් සිදු කරන බවත් එවිට අප සභාවෙන් සිදු වන කටයුතු පිළිබඳව දරුවන් දැන ගන්නා බවත් ගරු මන්ත්‍රී කේ.නාමල් අනුරුද්ධ සිරිවර්ධන ප්‍රනාන්දු මහතා ප්‍රකාශ කරන ලදී.

කොළඹ විශ්ව විද්‍යාලයෙන් පිරිසක් පැමිණෙන බවත්,ඔවුන් ඉදිරියේදී මැතිවරණය පැවැත්වීම සම්බන්ධයෙන් යම් වැඩසටහනක් කිරීමට සූදානමින් සිටින බවත්,ඒ සඳහා පක්ෂ විපක්ෂ ගරු මන්ත්‍රීවරුන් 6 දෙනෙකු සහභාගී වන ලෙසත් ගරු සභාපතිතුමා දැනුම් දෙන ලදී.

තමන් ඉදිරිපත් කල යෝජනාව සම්බන්ධයෙන් කටයුතු නොකිරීමට තිබෙන අවස්ථාව පිළිබඳව තමන් නොදන්නා බවත්, ගරු මන්ත්‍රී කේ.නාමල් අනුරුද්ධ සිරිවර්ධන ප්‍රනාන්දු මහතාගේ යෝජනාවද හොඳ බවත් තමන් බොහෝ දුරට බලාපොරොත්තු වූයේ නිදහස පිළිබඳ කථික තරගයක් බවත් ගරු මන්ත්‍රිනී අයි.එච්.නයෝමි රම්‍යලතා මහත්මිය ප්‍රකාශ කරන ලදී.සහතික පතක් පමණක් ලබාදීම ප්‍රමාණවත් බවත් ප්‍රකාශ කරන ලදී.අන්තර් කොට්ඨාස මට්ටමින් ප්‍රාථමික ,කණිෂ්ඨ හා ජ්‍යේෂ්ඨ ලෙස වෙන් කර මෙම කටයුත්ත සිදු කරමුයැයිද තවදුරටත් ප්‍රකාශ කරන ලදී.

මේ පිළිබඳව පාසල් දැනුවත් කල හැකි බව ගරු මන්ත්‍රී කේ.නාමල් අනුරුද්ධ සිරිවර්ධන ප්‍රනාන්දු මහතා ප්‍රකාශ කරන ලදී.

මේ පිළිබඳව ප්‍රජා කමිටුවේදී සාකච්ඡා කර අවශ්‍ය කටයුතු සලසා දෙන ලෙස ගරු සභාපතිතුමා විසින් ප්‍රජා කමිටුවේ සභාපති ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතාට දැනුම් දෙන ලදී.

(iv).2023 වර්ෂයේ අයවැය අනුව වෙන්නප්පුව ප්‍රාදේශීය සභා බල ප් දේශයේ ජීවත් වන ජ්‍යේෂ්ඨ පුරවැසියන් 27 දෙනෙකු ඇගයීම සඳහා රු.50,000.00ක මුදලක් වැය දැරීම සුදුසු බවට ගරු සභාපතිතුමා යෝජනා කරන ලදී.

| |
|---|
| තීරණ අංක 22<br><br>2023 වර්ෂයේ අයවැය අනුව වෙන්නප්පුව ප්‍රා දේශීය සභා බල ප්‍ර දේශයේ ජීවත් වන ජ්‍යේෂ්ඨ පුරවැසියන් 27 දෙනෙකු ඇගයීම සඳහා රු.50,000.00ක මුදලක් වැය දැරීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් ගෙන එන ලද යෝජනාව ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා විසින් ස්ථිර කරන ලදී. ඒ අනුව ඒ සඳහා මහා සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදී. |

(vi).පසුගිය කාලයේදී වරිපනම් සීමාව පිළිබඳව ගැසට් නිවේදනයට යවා ඇති බවත්,මෙහි ප්‍රගතිය පිළිබඳව ගරු මන්ත්‍රී යූ.ජූඩ් එම්මානුවෙල් මහතා විසින් විමසා සිටින ලදී.

✪ ගරු සභාපතිතුමාගේ හා ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතාගේ යෝජනා ස්ථිරත්වයෙන් මහා සභා අවස්ථාව කාරක සභා අවස්ථාවක් බවට පත්කර විෂයභාර නිලධාරී ජේ.ඒ.ඩී.ඒ.පී.එස්.ජයසූරිය මහතාට මේ පිළිබඳව සභාව දැනුවත් කිරීම සඳහා අවස්ථාව සලසා දෙන ලදී.

දැනට වෙන්නප්පුව උප බල ප්‍රදේශයේ වරිපනම් ඒකක යාවත්කාලීන කර තක්සේරු කර අවසන් කර ඇති බවත්,එම තක්සේරු වාර්තාව තක්සේරු දෙපාර්තමේන්තුව මඟින් ලැබිය යුතුව තිබෙන බවත්,ඒ

අතරතුර අද දින කම්මල්පත්තුව උප බල ප්‍රදේශයේ වරිපනම් ඒකක යාවත්කාලීන කිරීම ආරම්භ කල බවත්,මේ වර්ෂය අවසානයේදී ඉතිරි උප බල ප්‍රෙද්ශ වලද මෙම කටයුතු සියල්ල යාවත්කාලීන කර තක්සේරු කර අවසන් කිරීමට සැලසුම් කර ඇති බවත් ප්‍රකාශ කරන ලදී.තක්සේරුව ක්‍රියාත්මක කිරීම 2024 වර්ෂයේ සිට හැකි වන බවත් තවදුරටත් ප්‍රකාශ කරන ලදී.

ජනවාරි මස 01 වන දා සිට වෙන්නප්පුව කොටසේ අය කිරීම් කරන බවට ගරු සභාපතිතුමා පැවසූ බව ගරු මන්ත්‍රී යූ.ජූඩ් එම්මානුවෙල් මහතා ප්‍රකාශ කරන ලදී.

එය නිළ වශයෙන් ක්‍රියාත්මක කිරීමට තක්සේරු දෙපාර්තමේන්තුව විසින් ලබානොදුන් බව අදාල නිලධෘරී මහතා විසින් පවසා සිටින ලදී.

තමන් මෙම කාරණාව සම්බන්ධයෙන් 2022 දෙසැම්බර් මාසයේදී මහා සභාවේදී මේ පිළිබඳව යෝජනා කල බවත්,මෙම සභාවට ආදායම් ලබා ගැනීමට හැකි එකම ප්‍රධානම ආදායම් මාර්ගය වරිපනම් බවත්, නාත්තන්ඩිය ප්‍රා දේශීය සභාවේ 21000කට ආසන්න ඒකක තිබෙන බවත්,දැනට අප සභාවට 7000ක් පමණ තිබෙන බවත් ගරු මන්ත්‍රී යූ.ජූඩ් එම්මානුවෙල් මහතා ප්‍රකාශ කරන ලදී.අප මෙතරම් වැඩ කටයුතු කර තවමත් එය සිදු කර ගැනීමට නොහැකි වූ බවත්,වෙන්නප්පුව,කම්මල්පත්තුව ප්‍රදේශවලවත් මෙය ජනවාරි මාසයේ සිට කිරීමට නොහැකි වූ බවත් ප්‍රකාශ කරන ලදී.මෙම සිද්ධි පිළිබඳව පසුවිපරම් කිරීමට නොහැකියාව මේ සඳහා බලපා ඇති බවත්,මේ සඳහා වෙනම නිලධාරියෙකු පත් කිරීමට තමන් පැවසුවේ එබැවින් බවත් ප්‍රකාශ කරන ලදී.

දෙවන කාර්තුවේ සිටවත් මෙය ක්‍රියාත්මක කිරීමට උත්සාහ කරන ලෙසට ලේකම් මහතාට ගරු සභාපතිතුමා දැනුම් දෙන ලදී.මෙම වර්ෂය තුළ මාස 6ක් පමණ කටයුතු කිරීමේදී අයවැය අවසන් වේයැයි තමන් සිතනා බවත්,බඩු වල මිල ගණන් නැවතත් වැඩි වී ඇති බවත්,නමුත් ජනතාවගේ බදු මුදල් වැඩි කිරීමට නොහැකි බවත් මේ සඳහා විසඳුම මෙම වරිපනම් මුදල් බවත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.මේ පිලිබඳව වැඩි අවධානයක් යොමු කරන ලෙසත් ඉල්ලා සිටින ලදී.

ගරු සභාපතිතුමා පොරොන්දු වූ බවත් ඒ අනුව කටයුතු කරන ලෙසත් ගරු මන්ත්‍රී යූ.ජූඩ් එම්මානුවෙල් මහතා ප්‍රකාශ කරන ලදී.

කසල බද්ධ ලෙස රු.300.00ක බදු මුදලක් පැනවූ බවත් මෙම බදු මුදල ලැබෙන බැවින් එයද නතර කර තිබෙන බවත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.කසල ලබා ගැනීම වෙන්නප්පුව බල ප්‍රදේශයම පුළුල්ව ආවරණය කරන බවත්,සාමාන්‍ය පමණ නිවසකින් රු.2000.00ක්,බැරිම නිවසකින් එම මුදල්අය නොකර සිටීමට හැකි බවත් එලෙස එම වැඩ කටයුත්ත සිදු කරගෙන යා හැකි බව ප්‍රකාශ කරන ලදී.

දැනට මෙය කොතැන නතර වී තිබේදැයි ගරු මන්ත්‍රී යූ.ජූඩ් එම්මානුවෙල් මහතා විමසා සිටින ලදී.

තක්සේරු දෙපාර්තමේන්තුව ඔවුන්ගේ වාර්තාව ලබා දීමට තිබෙන බව ජේ.ඒ.ඩී.ඒ.පී.එස්.ජයසූරිය මහතා විසින් ප්‍රකාශ කරන ලදී.

එම ආයතනයට ලබා දී කොතරම් කාලයක්දැයි ගරු මන්ත්‍රී යූ.ජූඩ් එම්මානුවෙල් මහතා විමසා සිටින ලදී.

ඔවුන් කටයුතු අවසන් කර සතියක් පමණ වන බව ජේ.ඒ.ඩී.ඒ.පී.එස්.ජයසූරිය මහතා විසින් ප්‍රකාශ කරන ලදී.

එම ආයතනයට කතා කර විමසුවේදැයිද ගරු මන්ත්‍රී යූ.ජූඩ් එම්මානුවෙල් මහතා විමසා සිටින ලදී.

ඔවුන් සිදු කරනවාට වඩා මැනුම් කටයුතු කිරීමට අප විසින් භාරගත් බවත්,ඉන්පසුව ඔවුන් පරීක්ෂා කර බලා සීල් ගසා අත්සන් කර දීමට තිබෙන බව ජේ.ඒ.ඩී.ඒ.පී.එස්.ජයසූරිය මහතා විසින් ප්‍රකාශ කරන ලදී.මේ මාසයේ අවසන් වන බව ප්‍රකාශ කරන ලදී.

(vii).ඉන්ධන වාර්තාවේ ගැටළුවක් තිබෙන බවත්,51- 2298 අංක දරණ කැබ් රථය කුමන වැඩ කටයුතු සඳහා භාවිතා කරන්නේදැයිද ගරු මන්ත්‍රී එම්.එම්.ජිනේන්ද්‍ර විශ්වනාත් මංචනායක මහතා විමසා සිටින ලදී.

පසුගිය මාසයේ ලේකම් මහතා භාවිතා කල කැබ් රථය අළුත්වැඩියා කල බැවින් මෙම කැබ් රථය ලේකම් මහතාව ගෙන ඒමට ගෙන යාමට භාවිතා කල බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

මෙම වාහනයට වැඩිම ඩීසල් ප්‍රමාණයක් ගසා ඇති බවත්,ගරු සභාපතිතුමාගේ වාහනයටත් වඩා මෙයට තෙල් ගසා ඇති බවත් ගරු මන්ත්‍රී එම්.එම්.ජිනේන්ද්‍ර විශ්වනාත් මංචනායක මහතා ප්‍රකාශ කරන ලදී.

පසුගිය මාසය තුළ විශාල වැඩ කොටසක් කිරීමට සිදු වූ බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

(viii). වෙන්නප්පුව ප්‍රාදේශීය සභාවේ ලේකම් ලෙස පත්වී සිටින ඩබ්ලිව්. ඩී ලූෂන් මහතා සභාවේ ප්‍රධාන පරිපාලන නිලධාරී ලෙස රාජකාරියට වාර්තා කිරීමේදී, රාජකාරී ගමන්වල යෙදීමේදී සහ ආපසු නිවසට යාමේදී සභා අරමුදලින් ප්‍රවාහන පහසුකම් සැපයීමට ආදාල යෝජනාව ප්‍රාදේශීය සභා පණතේ 132(ච) වගන්තිය යටතේ ගරු සභාපතිතුමා ගරු මහා සභාවට ඉදිරිපත් කරන ලදී.

| |
|---|
| තීරණ අංක 23<br><br>වෙන්නප්පුව ප්‍රාදේශීය සභාවේ ලේකම් ලෙස පත්වී සිටින ඩබ්ලිව් ඩී ලූෂන් මහතා සභාවේ ප්‍රධාන පරිපාලන නිලධාරී ලෙස රාජකාරියට වාර්තා කිරීමේදී, රාජකාරී ගමන්වල යෙදීමේදී සහ ආපසු නිවසට යාමේදී සභා අරමුදලින් ප්‍රවාහන පහසුකම් සැපයීමට ආදාල යෝජනාව ප්‍රාදේශීය සභා පණතේ 132(ච) වගන්තිය යටතේ ගරු සභාපතිතුමා ගරු මහා සභාවට ඉදිරිපත් කල අතර එම යෝජනාව ගරු මන්ත්‍රී සී.පී.සරත් වික්‍රමරත්න මහතා විසින් ස්ථිර කිරීමෙන් පසුව විවාදයකින් තොරව ඒකමතිකව සම්මත විය. |

(ix). ගරු මන්ත්‍රී අයි.බී.සෑම් හරිෂ්නාත් සරත්චන්ද්‍ර මහතා ගරු සභාපතිතුමාගෙන් අවසර ගැනීමෙන් පසුව ගරු නිරෝශන් පෙරේරා මැතිතුමාගේ පියාණන් වන ගරු පෙස්ටස් පෙරේරා මැතිතුමා අභාවප්‍රාප්ත වී හෙට දිනට වසර 10ක් ගත වී තිබෙන බවත්, එතුමා සිහි කිරීම පිණිස ගුණකථනයක් සිදු කරන ලෙසට ගරු මන්ත්‍රී සී.පී.සරත් වික්‍රමරත්න මහතාගෙන් ඉල්ලා සිටින ලදී.

- ගරු මන්ත්‍රී සී.පී.සරත් වික්‍රමරත්න මහතා ගරු සභාපතිතුමා ඇතුළු සියළුම දෙනාගෙන් අවසර ගැනීමෙන් පසුව ප්‍රථමයෙන්ම සිහිපත් කල යුතු බවත්,දේශපාලනයට තමන්ව ගෙන ආවේ අභාවප්‍රාප්ත පෙස්ටස් පෙරේරා මැතිතුමා බවත් එතුමා මෙලොවින් සමුගෙන වසර 10 ගත වී ඇති බවත්,පක්ෂ විපක්ෂ කවුරුත් එතුමා ජනතාවට උපරිම සේවාවක් සිදු කල පුද්ගලයෙකු ලෙස පිළිගන්නා බවත් ප්‍රකාශ කරන ලදී.දකුණේ සිට උතුරට යන තෙක් ඇල්බට් ඇෆ් පීරිස් ක්‍රීඩාංගණය ලෙස ක්‍රීඩාංගණයක් නොමැති බවත්,ඒවා ඇසට පෙනීමට තිබෙන දේ බවත්,එතුමා කල සේවාවට ගරු කිරීමක් ලෙස ගරු සභාපතිතුමාද නිතරම එතුමාව මතක් කර දෙන බවත්, ගරු කල යුත්තාට ගරු කල යුතු බවත්,පිදිය යුත්තාට පිදිය යුතු බවත් එය අපගේ යුත්කමක් බවත් ප්‍රකාශ කරන ලදී. හෙට දින උදෑසන 9.30ට මෙත් නිවසේදී දිව්‍ය පූජාවක් පැවැත්වෙන බවත්,සවස් වරුවේ බෝධි පූජාවක්ද පැවැත්වෙන බවත් හැකි සෑම දෙනාටම ඒ සඳහා සහභාගී වන ලෙසත් ඉල්ලා සිටින ලදී.දේශපාලනයේදී සදාකාලික හතුරන් සහ මිතුරන් නොමැති බවත් තවදුරටත් ප්‍රකාශ කරන ලදී.දිනක් චන්ද්‍රිකා කුමාරතුංග මැතිණිය ජනාධිපතිතුමිය වී සිටි අවධියේදී තමන්ද එම නිවසේ රැඳී සිටි අවස්ථාවකදී උදෑසන 7ට ජනාධිපතිතුමියගෙන් දුරකථන ඇමතුමක් පැමිණි බවත්,එකල පක්ෂ මාරුවීම් සිදු වූ බවත් නමුත් එතුමියට තමන් පක්ෂයේ සිටින ජ්‍යෙෂ්ඨ මන්ත්‍රීවරයෙකු බැවින් පක්ෂය මාරු නොකරන බව එදින එතුමා පැවසූ බවත් එතුමා පක්ෂය ආරක්ෂා කල ආදර්ශමත් නායකයෙකු බවත් ප්‍රකාශ කරන ලදී.එතුමා තමන්ව දේශපාලනයට ගෙනා බවත් එක්සත් ජාතික පක්ෂයෙන් තමන් පමණක් ඉතිරි වී ඇති බවත් එතුමාගේ දේ ඉටු කර ගෙන යාමට තමන් සිටින බවත්

ප්‍රකාශ කරන ලදී.වර්තමාන ජනාධිපතිතුමා ද රට සාදාගෙන වන්දයකට යමුයැයි එතුමා පැවසූ බවත්,අප සියළුම දෙනා එකතු වී මෙම වැඩ කටයුතු සිදු කරමුයැයිද පවසන ලදී.එකල ක්‍රීඩාංගණය භාරව සිටියේ තමන් හා තවත් පුද්ගලයින් දෙදෙනෙකු බවත්,එවිට තරුණ නායකයෙකු අවශ්‍ය බව පවසා තමන්ව එතුමා දේශපාලනයට ගෙනා බවත්,දවල්ද රෑද යන්න මෙතුමා නොබැලූ බවත් එතුමා තුළ හොඳ ගුණාංග රාශියක් තිබූ බවත් පවසමින් එතුමාගේ පිංකම් සඳහා සහභාගී වන ලෙසටද සියළුම දෙනාට ආරාධනා කරමින් තම කතාව අවසන් කරන ලදී.

- පෙස්ටස් පෙරේරා මැතිතුමා ගැන පැවසීමට බොහෝ කරුණු කාරණා තිබෙන බවත්,තමන්ගේ ලොකු තාත්තාගේ භූමියට එකල අගමැති ඩඩ්ලි සේනානායක මැතිතුමා පැමිණි බවත්,මිල්රෝයි ඇමතිතුමාගේ දේශපාලනයත් සමඟ සියල්ල වෙනස් වූ බවත් ,දේශපාලනය කිරීමට බලාපොරොත්තුවෙන් නොසිටි බවත්,තමන් පත් වී අළුත වෙන්පුර අරුණළු නම් වැඩ සටහන තමන් සංවිධානය කල බවත්,එවිට එම ආරාධනා පත්‍රයද සමඟ තමන් එතුමාගේ නිවසට ගිය බවත් එම අවස්ථාවේදී එතුමා අඩ සිහියෙනි සිටි බවත් නමුත් ක්‍රීඩාංගණයේ නම පැවසීමේදී ඒක තමන් සැදූ ක්‍රීඩාංගණය බව පැවසූ බවත් එම අවස්ථාව තමන්ට අදටත් සිහිවන බවත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී. එතුමාට එම මතකය තිබූ බවත්, එම උපහාරය ලබා දීමට එතුමා වෙනුවට ලේකම් වරයෙකු එවූ බවත්,දකුණේ සිට උතුරට යන තෙක් නමක් ලෙස එතුමාගේ නම ප්‍රසිද්ධ වී තිබූ බවත් එතුමා විශාල වැඩ කොටසක් කල බවත්,සීනෝර් ජනපදය,දංකොටුව පෝසිලේන් ආයතනය,පන්සල් පල්ලි සියල්ල සඳහාම එතුමා දායකත්වය ලබා දුන් බවත් ප්‍රකාශ කරන ලදී.එතුමා කල කාර්ය භාරය අසීමිත බවත් එතුමා මියගොස් වසර 10ක් පමන වන බවත්,එතුමා වෙනුවෙන් කල හැකි උපරිම දායකත්වය ලබා දීමට තමන් කටයුතු කරන බවත් ප්‍රකාශ කරන ලදී.එතුමාව සිහි පත් කිරීම සම්බන්ධයෙන් ගරු මන්ත්‍රී අයි.බී.සැම් හරිෂ්නාත් සරත්චන්ද්‍ර මහතාට ස්තූතිය පුද කරන ලදී.ඇල්බට් ඇෆ් පීරිස් ක්‍රීඩාංගණය ඉදිරියට ගිය විට එතුමාගේ පින්තූරය සමඟ එතුමා ජීවමානව සිටින බවට තමන්ට පෙනෙන බවත් ප්‍රකාශ කරන ලදී.අපගේ නායකයන්ව සිහිපත් කිරීමට අපට හැකි විය යුතු බවත්,කල්පිටියට යාමේදී පෙස්ටස් පෙරේරා මැතිතුමාගේ හා මිල්රෝයි ප්‍රනාන්දු මැතිතුමාගේ නාමය තවමත් මතක් කරන බවත් ප්‍රකාශ කරන ලදී.ගොඩ්ප්‍රි ප්‍රනාන්දු මැතිතුමාගේ අභාවය සම්බන්ධයෙන්ද මහා සභාවේදී සාකච්ඡා කල බවත්,එලෙස සියළු දෙනාව මතක් කල යුතු බවත් ප්‍රකාශ කරන ලදී.අසූ ගණන් වල ඉපදුන පිරිස ලංකාවේ ඉතිහාසය පිළිබඳව නොදන්නා බවත්,එක් එක් කාල පරිච්ඡේද වල නායකයින් ඇගයීම සඳහා වැඩ පිළිවෙලක් සකස් කරමුයැයිද පවසමින් තම කතාව අවසන් කරන ලදී.
- ගරු මන්ත්‍රී එල්. සුසන්ත ශ්‍රීනාත් ප්‍රනාන්දු මහතා ගරු සභාපතිතුමා ඇතුළු සියළු දෙනාගෙන් අවසර ගැනීමෙන් පසුව ගරු පෙස්ටස් පෙරේරා මැතිතුමා පිළිබඳව කතා කලහොත් මෙම සියළු දෙනාම එතුමා පිළිබඳව ඉතාමත් හොඳ මතයකින් කතා කරන බවත්,එතුමාගේ පිංකම හෙට දිනයේදී සිදු වන බවත් ප්‍රකාශ කරන ලදී.ඇල්බට් ඇෆ් පීරිස් ක්‍රීඩාංගණය පිළිබඳව කතා කිරීමට තමන් අදහස් කරන බවත්,ගරු පෙස්ටස් පෙරේරා මැතිතුමාගේ පවුලේ ඉඩම් පරිත්‍යාග කර මෙම ක්‍රීඩාංගණය ඉදි කල බවත්,එමෙන්ම එතුමාගේ ගුරුවරයා වූ ඇල්බට් ඇෆ් පීරිස් මහතා නාත්තන්ඩිය වෙන්නප්පුව එක් ආසයනයක් ලෙස තිබී වෙන්න්පුව එමගින් කැඩී පෙස්ටස් පෙරේරා මැතිතුමා මෙතැනට එන විට එය සිහිපත් වීමට එම නාමය ක්‍රීඩාංගණයට දැමූ බවත් ප්‍රකාශ කරන ලදී.එලෙසම පන්සල් 8ක් වෙන්න්පුව ආසනය තුළ අළුතින් ඉදි කර ඇති බවත්,එතුමා කතෝලිකයෙකු වුවත් බෞද්ධාගමත් සමඟ සමීපව එතුමා වැඩ කටයුතු කල බවත් ප්‍රකාශ කරන ලදී.නයිනමඩම ඒ එස් පී කාර්යාලය එක් දිනකින් ඉදි කල

බව තමන් අසා ඇති බවත්,එමෙන්ම වෙන්නප්පුව ඩිපෝව මෙතැනට ගෙනැවිත් ස්ථාපිත කර ගත් බවත්,එතුමාගේ කාලයෙන් පසුව ප්‍රහල කැබිනම් ධූරයක් පුත්තලමට නොලැබුණ බවත්,ප්‍රදේශයට ලබා ගැනීමට තිබෙන දේ අහිමි වූ බවත් ප්‍රකාශ කරන ලදී.ජනතාවගේ හදවත් තුළ නොමැකී තිබෙන නාමයක් ලෙස එතුමාගේ නාමය හැඳින්වීමට හැකි බවත් පවසමින් තම කතාව අවසන් කරන ලදී.

- ගරු මන්ත්‍රී ඩබ්.ඇලෙක්ස් නිශාන්ත ප්‍රනාන්දු මහතා ගරු සභාපතිතුමා ඇතුළු සියළු දෙනාගෙන් අවසර ගැනීමෙන් පසුව පාසල් කාලයේ අත්දැකීමක් තමන්ට බෙදා ගැනීමට තිබෙන බව ප්‍රකාශ කරන ලදී.1986 කාලයේදී තමන් වෙන්නප්පුව ශා. ජෝෂප් වාස් විද්‍යාලයේ අධ්‍යාපනය හදාරන අවධියේදී තමන් ප්‍රධාන ශිෂ්‍යනායකයා වී සිටියදී එවකට කැබිනම් ඇමති වී සිටියේ මෙතුමා බවත් ,ලංකාවේම තිබෙන ආයතන ගෙනැවිත් ප්‍රදර්ශනයක් කල බවත් එකල එතුමා සියළුම රජයේ ආයතන වලට කතා කර එම ප්‍රදර්ශනය කිරීමට විශාල සහයෝගය ලබා දුන් බවත් ප්‍රකාශ කරන ලදී.සියළුම අමාත්‍යංශ වලින් ප්‍රදර්ශන කුටි සකස් කල බවත්,ඇමතිවරුන් පස් දෙනෙකු දින පහක් ඒවා විවෘත කිරීමට පැමිණි බවත්,එවැනි ප්‍රදර්ශනයක් නැවතත් නොතිබුන බවත් තවදුරටත් ප්‍රකාශ කරන ලදී.තමන්ගේ පියා ක්‍රියාකාරී ශ්‍රී ලංකා නිදහස් පක්ෂ පාක්ෂිකයෙකු බවත්,එය දැනගෙන යම් යම් පුද්ගලයින් ගොස් එතුමාට එය පවසා මෙයට සහයෝගය නොදෙන ලෙසට පවසා තිබූ බවත්,නමුත් එතුමා සහයෝගය ලබා දුන් බවත් දේශපාලනය නොසලකා එතුමා තීන්දු තීරණ ගත් බවත් ප්‍රකාශ කරන ලදී.එවැනි හොඳ ගතිගුණ තිබූ නායකයෙකු බවත්,ජ්‍යෙෂ්ඨ නීතිඥයෙකු බවත් නමුත් එතුමාගේ නීතිඥ ජීවිතය අත්දැකිමට නොලැබුණ බවත් ,එතුමා මෙම ප්‍ර දේශයට පැමිණි අසහාය නායකයෙකු බවත් ප්‍රකාශ කරන ලදී.පිදිය යුත්තාව දේශපාලන භේදයකින් තොරව පුදන බවත්,එම පවුලට අදාල ශෝක යෝජනාව පුදන ලෙසත් ඉල්ලමින්, ගරු මන්ත්‍රී අයි.බී.සැම් හරිෂ්නාත් සරත්චන්ද්‍ර මහතාට මෙම යෝජනාව ගෙන ඒම සම්බන්ධයෙන් ස්තූතියද පුදමින් තම කතාව අවසන් කරන ලදී.

- ගරු පෙස්ටස් පෙරේරා මැතිතුමාගේ ගුණකථනයන් සිදු කිරීම පිළිබඳව ගරු මන්ත්‍රී අයි.බී.සැම් හරිෂ්නාත් සරත්චන්ද්‍ර මහතා විසින් සියළුම දෙනාට ස්තූතිය පුද කරන ලදී.

න්‍යාය පත්‍රය අනුව සියළු වැඩ කටයුතු අවසන් වූ හෙයින් සියලු දෙනාටම ස්තූතිය පළ කරමින් ගරු සභාපතිතුමා විසින් ප.ව 2.30 ට පමණ සභාවේ වැඩ කටයුතු අවසන් කරන ලදී.